# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,501 — 1965 සැප්තැම්බර් 9 වැනි බ්‍රහස්පතින්ද — 1965.9.9

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1207 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1216 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1216 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම ... ... ... | 1225 | විවිධ දැන්වීම් ... ... ... | 1227 |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස්පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩදෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුලව පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලට මෙන් ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

(iii) (ඒ) ඔවුන් තම ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයයෙන් ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(බී) ආධුනික/පරීක්ෂා කාලය ගතවී අවසන් වූ විට සේවයෙහි ස්ථිර කරන්නේ වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වය තෙක් වර්ග කර ඇති සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් ඔවුන් නියමිත කාලසීමා ඇතුළත සමත්වීම උඩය. නියමිත කාලසීමාව ඇතුළත මෙම ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු පඩි වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. තම ආධුනික/පරීක්ෂා කාලය කෙළවර වන විට කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ විභාගයෙන් සමත් නොවන යම් නිලධාරියෙක් වේ නම් ඔහුගේ සේවය කෙළවර කළ හැකි වන්නේ ය.

**සංලක්ෂ්‍යය.**—සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවයට බැඳෙන අය සේවයෙහි ස්ථිර කිරීමට පෙර සිංහල ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීමේ නියමයෙන් නිදහස් වෙති.

(iv) මෙම ධුරයෙහි සේවය ස්ථිර කරන දින සිට අවුරුදු දෙකක් ඇතුළත සිංහල භාෂාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ කාර්යක්ෂමතා කඩඉම පරීක්ෂණයකින් සමත් වීමටද ඔවුන්ට නියම වනු ඇත.

5. **අවශ්‍ය සුදුසුකම්.**—(i) තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුතුය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අඩුම අධ්‍යාපනික සුදුසුකම ලෙස නියමකොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු

## ඉල්ලුම් පත්‍රය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :———.

2. ලිපිනය :———.

3. (අ) උපන් දිනය :———.
   (ආ) 1966.1.1 දිනට වයස :———.

4. (අ) ජාතිය :———.
   (ආ) ලාංකිකයෙක් වූයේ ලියාපදිංචි වීමෙන් ද, නැතහොත් පෙළපතින් ද (ලියාපදිංචි වීමෙන් නම්, ලියාපදිංචි වීමේ සහතිකයේ පිටපතක් අමුණන්න) :———.
   (ඇ) ලාංකිකයෙක් වූයේ පෙළපතින් නම්—
      (අ) ඉල්ලුම්කරුගේ ද :———,
      (ආ) ඉල්ලුම්කරුගේ පියාගේ ද :———.
      (ඇ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ ආතාගේ ද : ———,
      (ඈ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තනුවන්ගේ ද : ———,
   (උත්පත්තිය සිදුවූ ස්ථාන නම් කරන්න).

5. ඔබ සමත්වී ඇති විභාගය :———.
   මාධ්‍යය සඳහන් කරන්න :———.

6. (අ) රිය පැදවීමේ ප්‍රවීණතා සහතික පත්‍රයේ අංකය :———.
   (ආ) රිය පැදවීමේ දක්ෂතාවය සහතික කර තිබෙන්නේ කුමන වාහනවලට ද ? :———.
   (ඇ) ප්‍රවීණතා සහතිකය නිකුත් කළ දිනය :———.
   (ඈ) බස්රථ හෝ ලොරි ආදී බර වාහන පැදවීමට සහතික පත්‍රය දීර්ඝ කර තිබේද ? :———.

7. මෝටර් යාන්ත්‍රික කටයුතු ගැන දැනුමක් තිබේද ? :———.

8. වෙනත් විශේෂ සුදුසුකම් :———.

9. දැනට කරන රැකියාව :———.

10. ඔබ මීට පෙර රජයේ රැකියාවක නියුක්තව සිටියේ ද ? එසේ නම් සේවය කළ කාලය සමග සේවා විස්තර, දෙපාර්තමේන්තුව සහ දරන ලද තනතුර හා කුමන කරුණක් නිසා එම දෙපාර්තමේන්තුවෙන් අස්වූවාද යන වග සඳහන් කරනු :———.

11. කිසිම ඉන්ෂුවරන්ස් සමාගමක් ඔබව ඉන්ෂුවර් කිරීමට අකමැති වී තිබේද ? :———.

12. චරිතය පිළිබඳව සහතික ලබාගත් දෙදෙනාගේ නම්, ලිපිනයන් සහ තොරතුරු :—
   (අ) ———.
   (ආ) ———.

13. ලංකා පොලිස් සේවයේ කොස්තාපල් කෙනෙකු හෝ රියැදුරෙකු වශයෙන් මීට පෙර ඉල්ලුම් කර තිබේද ? එසේ නම් එහි ප්‍රතිඵල මොනවාද ? ඒ ගැන ගෙනහැර දක්වීමට ලියකියවිලි සහ විස්තර ඉදිරිපත් කරන්න :———.

14. ඔබ හෝ ඔබගේ කිසියම් නෑදෑයෙක් නඩු හබවලට පැටලී, නැඩවා හෝ චෝදනා කර හෝ කිසියම් වරදකට වරදකරු වී තිබේද ? :———.

ඉහත සඳහන් විස්තර මගේ අවංක දැනීමේ හැටියට සත්‍ය සහ නිවැරදි බව ප්‍රකාශ කරමි.

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

ස්ථානය :———.

දිනය :———.

9-303—65.9.9. දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

### ප්‍රචාරක නිලධාරි තනතුර

ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රචාරක නිලධාරී තනතුර සඳහා මෙයින් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත් මෙම නිවේදනයෙ අග දැක්වෙන ආකෘති පත්‍රයේ ප්‍රකාර පිළියෙළ කර "කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ, ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ තැන" යන ලිපිනයට, 1965 සැප්තැම්බර් මස 27 දිනට හෝ එයට පෙර හෝ ලැබෙන සේ එවිය යුතු ය.

2. **වැටුප්.**—මේ තනතුරට අයත් වාර්ෂික වැටුප් ක්‍රමය රු. 2,820 පටන්ගෙන රු. 120 වාර්ෂික වේතනාධික 9 යක් ද, රු. 180 වාර්ෂික වේතනාධික 4 ක් ද ලැබ කෙළවර වාර්ෂික වැටුප රු. 4,620 ක් වේ. රුපියල් 3,900 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් වේ.

3. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අය විසින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

**සටහන.**—රජයේ සේවයේ ස්ථිර සේවකයකු තෝරාගනු ලැබුව හොත් පළමුවෙන් නියමිත කාල සීමාවක් තුළ වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබේ.

4. **සුදුසුකම්.**—සෑම ඉල්ලුම්කරුවකුම—

(ඒ) 1965 සැප්තැම්බර මස 27 වැනි දිනට තමන්ගේ වයස අවුරුදු 25 ට නොඅඩු බව ද, අවුරුදු 40 නොවැඩි බව ද; (රජයේ සේවකයින් සඳහා යටකී වයස් සීමාව බලපවත්වනු නොලැබේ).

(බී) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී ලබාගත් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් හයකින් යුත්, අධ්‍යයන පොදු (සාමාන්‍ය පෙළ) සහතිකය හෝ වඩා උසස් සහතිකයක් හෝ ලබා ඇත්තකු බව ද; සහ

(සී) (i) කාර්යක්ෂම ලෙස වෙළඳ දැන්වීම් කෙටුම් පත් කිරීම, ප්‍රචාරක කටයුතු හා ප්‍රචාරක ලිපි සහ ද්‍රව්‍ය සකස් කිරීම පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 5 ක පළපුරුද්දක් ඇති බව ද;
   (ii) ප්‍රකාශන සකස් කිරීම සහ මුද්‍රණ කටයුතු ගැන හොඳ දැනීමක් ලබා ඇති බව ද;

(ඩී) විශිෂ්ඨ චරිතයකින් සහ මනා ශරීර සුවයෙන් යුක්ත බව ද; ඔප්පු කිරීම පිණිස සහතික ඉදිරිපත් කළ යුතුය.

5. දැනටමත් රජයේ සේවයේ නියුක්ත අය විසින් එවනු ලබන ඉල්ලුම් පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. නියමිත දිනට පසුව ලැබෙන එවැනි ඉල්ලුම් පත් භාර ගනු නො ලැබේ. එහෙත් එවැනි ඉල්ලුම් පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත නියමිත දිනට ප්‍රථම ලැබ, පිළිගත හැකි කරුණක් නිසා, ඒවා ප්‍රමාද වූනි නම්, ඒ බව එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සහතික කළහොත් භාරගනු ලැබේ.

(6) නියම කරනු ලබන අවස්ථාවකදී ඉල්ලුම් කරුවන් විසින් පහත සඳහන් සහතික (මුල් සහතික) ඉදිරිපත් කළ යුතු ය :—

(ඒ) උප්පැන්න සහතිකය හෝ රෙජිස්ට්‍රාර් ජනරාල් තැන විසින් නිකුත් කරනු ලැබූ වයස පිළිබඳ විශේෂ සහතිකයක් ;

(බී) අධ්‍යාපනය අනුව ලබා ඇති උසස්ම සහතිකය ;

(සී) (i) කාර්යක්ෂම ලෙස වෙළඳ දැන්වීම් කෙටුම් පත් කිරීම, ප්‍රචාරක කටයුතු හා ප්‍රචාරක ලිපි සහ ද්‍රව්‍ය සකස් කිරීම පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 5 ක පළපුරුද්දක් ඇති බව, සහ
   (ii) ප්‍රකාශන සකස් කිරීම සහ මුද්‍රණ කටයුතු ගැන හොඳ දැනීමක් ලබා ඇති බව ඔප්පු කැරෙන සහතික ;

(ඩී) තම චරිතය සහ මෙම තනතුරට පත්වීම සඳහා තමාට ඇති සුදුසුකම් හා යෝග්‍යතාව ආදිය සම්බන්ධයෙන් මෑතදී ලබා ගත් සහතික තුනක්.

7. ඉල්ලුම් පත් සහ ඒ පිළිබඳ වෙනත් ලියුම් කියුම්, "කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂක තැන" යන ලිපිනයට පමණක් එවිය යුතුයි. ඒවා මගේ හෝ මෙම දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතු යි.

8. මේ ගැසට් පත්‍රයේ I වැනි කාණ්ඩයේ (II) වැනි ඡේදයේ මුල පළවෙන රාජ්‍ය සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලටද ඉල්ලුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

පී. එච්. පී. ද සිල්වා,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත
අධ්‍යක්ෂක.

1965 සැප්තැම්බර් 3 දින,
කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ,
ඉඩම් සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව.

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

**ප්‍රචාරක නිලධාරි තනතුර**

### ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නාමය (පැහැදිලි අකුරෙන්) :———.
   අගට යෙදෙන නම :———.
   වෙනත් නම් :———.

2. ලිපිනය :———.

3. පුරවැසි භාවය හා එය ලබාගත් අන්දම :—
   (ඒ) පරම්පරානුගතවද :———.
   (බී) ලියාපදිංචි කිරීමෙන් ද :———.

4. උපන් ස්ථානය :—
   (ඒ) ඉල්ලුම්කරුගේ :———.
   (බී) ඉල්ලුම්කරුගේ පියාගේ :———.
   (සී) ඔහුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :———.
   (ඩී) ඔහුගේ පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :———.

5. (ඒ) 1965 සැප්තැම්බර් 27 දිනට වයස :———.
   (බී) උපන් දිනය :———.
   (සී) විවාහකද ? අවිවාහකද ? යන වග :———.

6. සාමාර්ථය ලැබූ විෂයයන් හා දිනයන් ඇතුළුව ලබන ලද උසස් ම අධ්‍යාපනික සුදුසුකම් :———.

7. වෙළඳ දැන්වීම් කෙටුම්පත් කිරීම, ප්‍රචාරක කටයුතු හා ප්‍රචාරක ලිපි සහ ද්‍රව්‍ය සකස් කිරීම පිළිබඳ ලබා ඇති පළපුරුද්ද සහ කාර්යක්ෂමතාවය :———.

8. ප්‍රකාශන සකස් කිරීම සහ මුද්‍රණ කටයුතු ගැන ලබා ඇති පුහුණුව හා ශූරතාවය :———.

9. පාසලින් අස්වූ දිනය හා ඉගෙන ගත්තේ කවර පාසලක ද යන වග :———.

10. පාසලින් අස්වූ දින සිට කළ රක්ෂාවල් හා ඒ සම්බන්ධ වූ දිනයන් හා ආණ්ඩුවේ රක්ෂාවල් කරන ලද්දේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර :———.

11. කියවීම, ලිවීම, කථා කිරීම හා අර්ථ නිරූපණය පිළිබඳ ප්‍රවීණතාවය :—
    (ඒ) සිංහල :———.
    (බී) දෙමළ :———.

12. චරිත සහතික ලබා ගත් අයගේ නම්, තනතුරු හා ලිපිනයන් :
    ———.

13. ඉල්ලුම්කරු පෞද්ගලිකව හඳුනන දෙදෙනකුගේ නම්, තනතුරු හා ලිපිනයන් :———.
    ———.

14. වෙනත් සුදුසුකම් හා ඉදිරිපත් කළ හැකි විශේෂ අයිතිවාසිකම් ඇත්නම් ඒ සම්බන්ධ විස්තර :———.

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———.

9–313—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

අංකය : ශිෂ්‍ය/522

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

**1966 කැනඩා පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව**

1966 සැප්තැම්බර් මැද සිට ආරම්භ වන අධ්‍යයන වර්ෂයේ සිට කැනඩාවේ ඉගෙනීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ පිරිනැමෙන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

ලාංකික සිසුන්ට කැනඩාවේ උසස් පාඨශාලා අනුගමනය කිරීමට හෝ පර්යේෂණ කටයුතුවල යෙදීමට හෝ අවස්ථාවක් ලබාදීම ශිෂ්‍යත්ව ප්‍රදානයන්ගේ අදහසයි. ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලබන්නේ පශ්චාත් උපාධි අධ්‍යාපනය හෝ පර්යේෂණ සඳහා පමණය. ප්‍රථම උපාධි පාඨමාලා සඳහා අයදුම් පත් භාරගනු නොලැබේ.

අධ්‍යයන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සීමාවක් නැත ද, දැනටමත් ආචාර්ය උපාධියක් දරන අපේක්ෂකයින්ට හෝ වෛද්‍ය උපාධි, දන්ත වෛද්‍ය උපාධි හා චිකිත්සාගාර පුහුණුව සඳහා මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය නොකැරෙන බව සැලකිය යුතුයි.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බල පොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂය 1.**—රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම් කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍රලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමඟ ඉදිරිපත් කළ යුතු ය.

**සංලක්ෂය 2.**—මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම් පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතු ය.

**සංලක්ෂය 3.**—එක් අයදුම් කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණ ය. ඉල්ලුම් කළ යුත්තේ ද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණ ය.

2. **ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් අධ්‍යයන වර්ෂ 2 ක් හා අතරතුර ග්‍රීෂ්ම සෘතුව සඳහා වන්නේ ය. නියමිත පාඨමාලාව සඳහා කෙටි කාලයක් ප්‍රමාණවත් වන අවස්ථාවන්හි ශිෂ්‍යත්ව කාලය කෙටිවනු ඇත. පාඨමාලාව සඳහා වැඩි කාලයක් අවශ්‍ය වේ නම් හා ශිෂ්‍යත්වධාරියාගේ වාර්තාව සතුටුදායක වේ නම්, විශේෂ අවස්ථාවන්හිදී වැඩි කාලයක් සඳහා දීර්ඝ කිරීමට ඉඩ ඇත.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ කැනේඩියනු බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. **සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—
   (අ) ලංකාවේ පුරවැසියන් විය යුතු යි ;
   (ආ) 1966.10.1 වැනි දිනට, වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතු යි ;
   (ඉ) රජයේ සේවකයෙක් නම්, 8 වැනි ප්‍රමාණයේ මට්ටමට සිංහල දැනීමක් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ හැකි විය යුතු යි ;
   (ඊ) අදහස් කරන පාඨමාලාවට උචිත (පිළිගත් විශ්ව විද්‍යාලයක) දෙවැනි පෙළ උපාධියක් වත් යටත් පිරිසෙයින් තිබිය යුතුයි. (ප්‍රතිඵල අපේක්ෂාවෙන් අයදුම් පත් භාරගනු නොලැබේ.) ;
   (උ) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් ප්‍රවීණත්වයක් තිබිය යුතුයි.

**සංලක්ෂය 1.**—රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට, 1966.10.1 වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්ෂය 2.**—එසේම තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන්ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම්පතේ 15(ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—
   (අ) කැනඩාව බලා යාමේ සහ ආපසු පැමිණීමේ ගමන් වියදම් (සාමාන්‍යයෙන්, කැනඩා රජයේ විදෙශ ආධාර කාර්යාලය විසින් පිළියෙල කරන පරිදි, ඉතාම කෙටි මඟින් සංචාරක පන්තියේ ගුවන් ගමන් සඳහා) ;
   (ආ) අනුමත කළ ඉගැන්වීමේ ගාස්තු හා විශ්ව විද්‍යාල ගාස්තු (කාම පීම් හා නේවාසික ගාස්තු හැර) ;
   (ඇ) මසකට ඩොලර් 165 බැගින් පෞද්ගලික යැපීම් දීමනාවක් ;
   (ඈ) අනුමත කළ වෛද්‍ය හා ආරෝග්‍යශාලා වියදම් ;
   (ඉ) පොත් සඳහා ප්‍රථම වර්ෂයේ ඩොලර් 100 ක හා ඊට පසු අවුරුදුවල ඩොලර් 75 බැගින් දීමනාවක් ;

(ඇ) මෑතකදී ලබා ගන්නා ලද චරිත පිළිබඳ සහතික දෙකක්.

6. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර හා පිළිබඳ වෙනත් ලියකියවිලි වැඩ බලන ආයුර්වේද කොමසාරිස්තුමා, ආයුර්වේද දෙපාර්තමේන්තුව, කොටෑරෝඩ්, කොළඹ 8 යන ලිපිනයට මිස දෙපාර්තමේන්තුවේ සේවය කරන කිසියම් නිලධාරියෙකුගේ පුද්ගලික නාමයට නොඑවිය යුතුයි.

7. මෙම ගැසට් නිවේදනයේ I වෙනි කොටසේ II වැනි ඡේදයේ මූලාරම්භයේ පළවී ඇති රාජ්‍ය සේවා තනතුරුවලට පත් කිරීම පිළිබඳ පොදු කොන්දේසිවලට ඔබේ අවධානය මෙයින් යොමු කරනු ලැබේ.

වැ. බ. ආයුර්වේද කොමසාරිස්.

1965 ක්වූ සැප්තැම්බර් මස 3 වෙනිද,
කොළඹ 8,
ආයුර්වේද දෙපාර්තමේන්තුවේදීය.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**කායච්ඡේද ප්‍රදර්ශක තනතුරක් (ආයුර්වේද අංශය)**

1. **සම්පූර්ණ** නම (පැහැදිලි අකුරෙන්) :————.
   (අ) පෙළපත් නාමය :————.
   (ආ) අනික් නම් :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා ස්ථානය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.
   1965 සැප්තැම්බර් මස 24 වෙනිදාට සම්පූර්ණ වයස :—
   අවුරුදු :—, මාස :— දින :—.

4. ජාතිය :————.

5. අධ්‍යාපනික සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුයි) : ————.

6. වෘත්තීය සුදුසුකම් (සහතික පිටපත් ඇමිනිය යුතුය.) :————.

7. පළපුරුද්ද :————.

8. වෙනත් සුදුසුකම් :————.

මා විසින් මෙම අයදුම් පතෙහි සඳහන් කර ඇති තොරතුරු සැබෑ බවද, නිවැරදි බවද මෙයින් සහතික කර සිටිමි. මෙහි දක්වා ඇති තොරතුරු යම් හෙයකින් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර දන ගන්නට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා සේවයෙන් පහකරනු ලබන බවද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–438—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

**ප්‍රවෘත්ති වාර්තාකරු තනතුරු**

ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රවෘත්ති වාර්තාකරු තනතුරු සඳහා ඉල්ලුම් පත් භාරගනු ලැබේ. මෙම දැන්වීමේ අග දක්වෙන ආකෘතියේ ආකාරයට සැපයිය යුතු ඉල්ලුම් පත්, 1965 සැප්තැම්බර් 24 වැනි දින නොඉක්මවා ලැබෙන සේ, කොළඹ 7, ලංකා ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ආකෘති පත්‍ර සපයනු නොලැබේ. කවරයේ ඉහළ වම් කෙළවර "ප්‍රවෘත්ති වාර්තාකරු තනතුර" යන්න පැහැදිලි අකුරෙන් ලිවිය යුතු යි.

2. **වැටුප්.**—මාසික වේතනයක් වශයෙන් රු. 200ක ස්ථාවර ගෙවීමක් හා ගමන් වියදම් වශයෙන් රු. 50 ක්ද ගෙවනු ලැබේ. වෙනත් දීමනාවක් ගෙවනු නො ලැබේ.

3. **පත්වීමේ කොන්දේසි.**—තනතුර දෙනු ලබන්නේ කොන්ත්‍රාත් ක්‍රමයකටය. ලිත් මසක කල්දීමකින් සේවය නමාර කළ හැකිය.

3. **අවශ්‍ය සුදුසුකම් :**

(1) සෑම අයදුම්කරුවෙකු විසින්ම යට දක්වෙන සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ මනායි :—

(අ) 1965 සැප්තැම්බර් 24 වැනි දිනට තමන් වයසින් අවුරුදු 21ට නොඅඩු හා 40ට නොවැඩි බව ;

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඒ සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් ලබන ලද සාමාර්ථය හා පුවත්පත් ලේඛන කටයුතු පිළිබඳ අවුරුදු 2 ක පළපුරුද්දක් ඇති බව ;

(ඇ) සිංහල පිළිබඳ මනා දැනුමක් ඇති බව ;

(ඈ) යහපත් චරිතයකින් ද කායික සුවයකින් යුක්ත බව.

(2) ලංකා ගුවන් විදුලි සේවයේ ප්‍රචාරය කරනු ලබන ප්‍රවෘත්ති නිවේදනවලට ඇතුළත් කළ හැකි පුවත් හා තොරතුරු රැස්කිරීම තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ කාර්ය වනු ඇත.

5. අයදුම්කරුවන් විසින් යට දක්වෙන ලියවිලිවල පිටපත් (මුල් ලියවිලි නොවේ) ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි :—

(අ) ඉහළම අධ්‍යාපනික සුදුසුකම් දක්වෙන සහතිකය ; සහ

(ආ) අයදුම්කරුගේ සුදුසුකම, චරිතය සහ මෙම තනතුර දැරීමට සුදුසු බව පළවෙන මෑතකදී ලබාගත් සහතික දෙකක්. (දැනට රජයේ සේවයේ සිටින අයදුම්කරුවන්ගෙන් මේ උපඡේදය යටතේ සහතික අනවශ්‍යය.)

**සැලකිය යුතුයි.**—මේ සහතික ලියවිලි පිටපත් අයදුම්කරුවන් වෙත පෙරළා එවනු නොලැබේ. එහි මුල් පිටපත් ඉදිරිපත් කළ යුත්තේ අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවුවහොත් හා එවිටය.

6. නියමිත දින ඉක්මවා රජයේ සේවකයන්ගෙන් මෙම කාර්යාලයට ලැබෙන ඉල්ලුම්පත්, එම දිනට පළමු ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ලැබී ඇත්නම් හා ප්‍රමාදයට පිළිගත හැකි හේතු දක්වමින් ඉල්ලුම්පත් භාරගන්නා ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිර්දේශ කර ඇත්නම් මිස පිළිගනු නොලැබේ.

7. ඉල්ලුම්පත් හා ඒ සම්බන්ධ ලියවිලි එවිය යුත්තේ ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත මිස මෙම දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරීන්ට පුද්ගලිකව නොවේ.

8. ඉල්ලුම් පත් ලැබුණ බව දන්වනු නොලැබේ.

වින්සන්ට් පණ්ඩිත,
වැඩබලන ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

1965 සැප්තැම්බර් මස 4 වැනි දින,
කොළඹ 7.

## ඉල්ලුම් පත්‍ර ආකෘතිය

**ප්‍රවෘත්ති වාර්තාකරු තනතුරු**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන් ලියන්න) :————.
   (අ) වාසගම (හෙවත් අගට යෙදෙන නම) :————.
   (ආ) සෙසු නම් :————.

2. ස්ථිර ලිපිනය :————.

3. 1965 සැප්තැම්බර් මස 24 වැනි දිනට නියම වයස : **අවුරුදු :** ——, මාස :——, දින :——.

4. ජාතිය :————.
   (අ) ලාංකිකත්වය ලියාපදිංචි කිරීමෙන්ද, පෙළපතෙන්ද යන වග :————.
   (ආ) ලාංකිකත්වය පෙළපතින් නම් යට සඳහන් අය උපන් ස්ථානය දක්වන්න :—
      (1) අයදුම්කරු :————.
      (2) අයදුම්කරුගේ පියා:————.
      (3) අයදුම්කරුගේ පියාගේ පියා :————.
      (4) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

5. අධ්‍යාපනික සුදුසුකම් :—
   (අ) සිංහල :————.
   (ආ) දෙමළ :————.
   (ඉ) ඉංග්‍රීසි :————.

6. ලේඛන කලාව පිළිබඳ පළපුරුද්ද :————.

7. චරිතය පිළිබඳ සහතික සැපයූ අයගේ නම් සහ ලිපිනයන් : ————.

8. සේවා මුක්ත භටයින් උදෙසා පිරිනැමෙන පහසුකම් ලබා ගන්නේද යන වග (එසේ නම් යුද්ධ සේවයෙන් අස්වීමේ සහතිකය හෝ ඒ පිළිබඳ අනෙක් ලියවිලි සාක්ෂි ඇමිණිය යුතුයි) :————.

9. කිසි කලෙක රජයේ සේවයේ යෙදී සිටියේ නම් කවදා, කොතැනද යන වග (එක් එක් දෙපාර්තමේන්තුවේ සේවය කළ කාලය දක්වන්න) :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–440—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

5. යට දැක්වෙන ලියවිලිවල පිටපත් (මුල් ලියවිලි නොවේ) ඉල්ලුම් පත්වලට අමුණා එවිය යුතුයි :—

(i) ඉහළම අධ්‍යාපනික සුදුසුකම් දැක්වෙන සහතිකය/සහ හෝ වෙනත් සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ii) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, හැකියාව සහ මෙම තනතුරට යෝග්‍ය බව සඳහන් මෑතකදී ලබාගත් සහතික පත් දෙකක් (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් ගෙන් මෙම උපශීර්ෂය යටතේ නියමිත ලියවිලි අනවශ්‍යය).

**සැලකිය යුතුයි.**—මෙහි සහතික පිටපත් අයදුම්කරුවන් වෙත පෙරළා එවනු නොලැබේ. මුල් ලියවිලි ඉදිරිපත් කළ යුත්තේ අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවුවහොත් හා එවිටය.

6. රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් එවන ඉල්ලුම්පත් නියමිත දින ඉක්මවා ලැබුණහොත් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ඒවා ලැබී ඇත්තේ නියමිත කාලසීමාව තුළ නම් හා ප්‍රමාදයට ඒත්තුවන හේතු දක්වන්නේ නම් මිස ඒවා පිළිගනු නොලැබේ.

7. ඉල්ලුම්පත් හා ඒ සම්බන්ධ සෑම ලියවිල්ලක්ම එවිය යුත්තේ ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් නමට මිස දෙපාර්තමේන්තුවේ අන් කිසි නිලධාරියෙකුගේ පෞද්ගලික ලිපිනයට නොවේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදයේ මුල පළවෙන රජයේ සේවයේ තනතුරුවලට පත්කිරීම සහ අදාළ පොදු කොන්දේසි බලන්න.

9. ඉල්ලුම් පත් ලැබුනු බව දන්වනු නොලැබේ.

වින්සන්ට් පණ්ඩිත,
වැඩබලන ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

1965 සැප්තැම්බර් මස 4 දින,
කොළඹ 7,
ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේදී ය.

### ඉල්ලුම් පත්‍රයේ අදර්ශ ආකෘතිය

**ප්‍රවෘත්ති සහායක තනතුරු**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන් ලියන්න) :———.
   (අ) වාසගම හෙවත් අගට යෙදෙන නම :———.
   (ආ) සෙසු නම් :———.
2. සථිර ලිපිනය :———.
3. (අ) 1965 සැප්තැම්බර් මස 24 දිනට නියම වයස :—
   අවුරුදු——, මාස——, දින——.
   (ආ) උපන් දිනය :———.
4. ජාතිය :———.

(1) ලාංකිකත්වය ලියා පදිංචි කිරීමෙන්ද, පෙළපතින්ද යන වග

(2) ලාංකිකත්වය පෙළපතින් නම් යට දැක්වෙන අය උපන් තැන දන්වන්න :—
   (අ) අයදුම්කරු :———.
   (ආ) අයදුම්කරුගේ පියා :———.
   (ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :———.
   (ඈ) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :———.

5. අධ්‍යාපනික සහ/හෝ වෙනත් සුදුසුකම්———.
   සිංහල :——, දෙමළ :——, ඉංග්‍රීසි :——.
   (ඉහත 5 (i) වැනි ඡේදයේ ප්‍රකාර සහතික පිටපත් අමුණන්න)
6. ලඝුලේඛක හා යතුරු ලේඛක වේගය—
   සිංහල, දෙමළ——, ඉංග්‍රීසි.
7. අමුනා ඇති චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපිනයන් :———.
8. සේවා මුක්ත භටයින් උදෙසා පිරිනැමෙන අනුග්‍රහයෙන් ප්‍රයෝජන ගන්නේද යන වග. (එසේ නම් සේවයෙන් අස්වී යාමේ සහතිකය හෝ වෙන යම් සාක්ෂි හෝ අමුනා එවිය යුතුයි) :———.
9. රජය යටතේ කිසිවිටෙක සේවය කර ඇත්නම් ඒ කවදා කොතැනද යන්න. (එක් එක් දෙපාර්තමේන්තුවේ කළ සේවා කාලය දැක්විය යුතුය :———.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය———.

9–432—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ඖෂධ වේදී තනතුරු

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආයුර්වේද අංශයේ ඖෂධ වේදී තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ. පහත දැක්වෙන ඈදශී ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම් පත් 1965 සැප්තැම්බර් මස 24 දිනට හෝ එයට පෙර ආයුර්වේද කොමසාරිස්, ආයුර්වේද දෙපාර්තමේන්තුව, කොළඹ 8 යන මගේ රාජකාරි ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට රු. 2,100—120—3,060 දක්වා වූ වාර්ෂික වැටුපක් හිමිය.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුරු සථිරය. විශ්‍රාම වැටුප් සහිතය, රජයේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. තෝරා ගන්නා අයදුම්කරු පළමුකොට තුන් අවුරුදු ආධුනික කාලයකට යටත් කොට බඳවා ගනු ලැබේ. තෝරා ගන්නා අයදුම්කරු විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තුමා විසින් තීරණය කරනු ලබන අයුරින් මුදලින් ඇපයක් තැබිය යුතුය.

4. **අවශ්‍ය සුදුසකම්.**—සෑම අපේක්ෂකයෙක්ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) ලංකාවේ හෝ ඉන්දියාවේ රජය පිළිගත් ආයුර්වේද වෛද්‍යායතනයකින් පිරිනමන ලද උපාධි සහතිකයක් ලබා සිටිය යුතුය. විශාල ප්‍රමාණයක් ඖෂධ නිෂ්පාදනය කිරීම පිළිබඳව මනා පළපුරුද්දක් ලබා ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ii) 1965 සැප්තැම්බර් මස 24 දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35 කට නො වැඩි විය යුතුය.

(iii) යහපත් චරිතයකින් හා මනා ශරීර ශක්තියකින් යුක්ත විය යුතුයි.

5. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පිටපත් (මුල් සහතික නොවේ). ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතික (**සැ. යු.**—බෞතීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාසැල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයන් සඳහා නිකුත් කරන ලද සහතික පත්‍ර භාරගනු නොලැබේ).

(ආ) ලබා ගත් උසස්ම වෘත්තීය හා ශාස්ත්‍රීය සහතික පත්‍ර.

(ඇ) චරිතය පිළිබඳව මෑතක දී ලබා ගත් සහතික පත්‍ර දෙකක් (රජයේ සේවයේ නියුක්ත වූවන්ට මෙම උප වගන්තිය යටතේ සහතික පත්‍ර ඉවමනා නොකෙරේ.)

**සැලකිය යුතුයි**—ඉහත සඳහන් සහතික පත්‍ර ආදියේ පිටපත් ආපසු එවනු නො ලැබේ.

6. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) ඡේදයේ ආරම්භයේ රාජ්‍ය සේවා තනතුරුවලට අදාළ වන පොදු කොන්දේසි මෙම තනතුරු කෙරෙහි ද බලපානු ලැබේ. එකී කොන්දේසි බලන්න.

වැඩබලන ආයුර්වේද කොමසාරිස්.

1965 9. 3 දින,
කොළඹ 8.
ආයුර්වේද දෙපාර්තමේන්තුවේදී ය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**ආයුර්වේද දෙපාර්තමේන්තුව**

**ඖෂධ වේදී තනතුරු**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්)———.
   (අ) පෙළපත් නාමය :———.
   (ආ) අනික් නම් :———.
2. ලිපිනය :———.
3. උපන් දිනය සහ ස්ථානය :———.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
   1965.9.24 දිනට සම්පූර්ණ වයස :—අවු :——, මාස :——, දින :——.
4. ජාතිය :———.
5. අධ්‍යාපන සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුයි :———.
6. වෘත්තීය සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුයි). :———.
7. ඖෂධ වේදියකු ලෙස ලබා ඇති පළපුරුද්ද :———.
8. වෙනත් සුදුසුකම් :———.

ම විසින් මෙම අයදුම් පතෙහි සඳහන් කර ඇති තොරතුරු සැබෑ බවද, නිවැරදි බවද, මෙයින් ප්‍රකාශ කර සිටිමි. මෙහි දක්වා ඇති තොරතුරු යම් හෙයකින් අසත්‍ය බව හෝ, වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර දැන ගන්නට ලැබුණහොත්, මා පත්වීම ලැබීමට නො සුදුස්සකු වන බවද, පත්වීමට පසු දැන ගන්නට ලැබුණහොත්, කිසිම වන්දි මුදලක් නො ගෙවා සේවයෙන් පහ කරනු ලබන බවද මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

9–467—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## 1966 වර්‍ෂයේ දී ප්‍රාථමික පාසල්වලට හා පංතිවලට ළමුන් ඇතුළත් කර ගැනීම

ප්‍රාථමික පාසල් හා පංතිවලට ළමුන් ඇතුළු කිරීම 1966 ජනවාරි මාසයේ දී සිදු කරනු ලැබේ. ඇතුලත් කර ගැනීම සඳහා 1966 ජනවාරි මස 1 වැනිදාට වයස අඩුවශයෙන් අවුරුදු පහක් විය යුතුය. එනම් 1961.1.1 වැනිදා හෝ ඉන් පෙර උපන් ළමයින් පමණක්ය, ඇතුලත් කරගනු ලබන්නේ. ළමුන් ඇතුලත් කිරීමට බලාපොරොත්තු වන දෙමව්පියන් විසින් 1965.9.30 වැනි දාට හෝ ඉන් පෙර තම පදිංචි නිවසට ඉතාම කිට්ටු පාසැලට පහත දැක්වෙන අන්දමේ ආකෘති පත්‍රයේ ප්‍රකාර ඉල්ලුම් පත්‍රයක් යැවිය යුතුයි.

ඇතුලත් කිරීමේ පරීක්‍ෂණ පවත්වනු නො ලැබේ. ඇතුලත් කිරීමේදී පාසලට ඉතාම ආසන්නව පදිංචිව ඇති ළමුනට ප්‍රමුඛතාවය දෙනු ඇත.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්‍ෂ.

1965 සැප්තැම්බර් මස 6 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

**පෝරමය**

1. ඇතුලත් කිරීමට බලාපොරොත්තු වන පන්තිය :————.
2. මාධ්‍යය :————.
3. ළමයාගේ නම :————.
4. ජාතිය :————.
5. උපන් දිනය හා ස්ථානය :————.
6. දෙමව්පියන්ගේ ආගම :————.
7. ළමයා පාසැලට එන ස්ථානයේ ලිපිනය :————.
8. එම ලිපිනයේ සිට පාසැලට ඇති නියම දුර :————.
9. දෙමව්පියන්ගේ නම සහ ලිපිනය :————.
10. ඡන්දදායක ලැයිස්තුවේ සඳහන් ලිපිනය :————.
11. දෙමව්පියන් ඡන්ද දායකයන් වශයෙන් ලියාපදිංචි වී නැත් නම් එයට හේතු :————.
12. පසුගිය දෑවුරුදු තුන තුළ ළමයාගේ පදිංචි ස්ථානය :————.
13. ළමයා මෙතෙක් ඉගෙනගත් පාසල හෝ පාසල් : ————.
14. අන්තිමට සමත්වූ පන්තිය :————.
15. පාසල වෙනස් කිරීමට හේතු :————.
16. පාසලේ දැනට සිටින වැඩිමහල් සහෝදර සහෝදරියන් පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් සියලු විස්තර නිවැරදි බව ප්‍රකාශ කරන අතර යම් විස්තරයක් වැරදියයි ඔප්පු වුවහොත් මගේ ළමයා මෙම පාසලෙන් අස් කර ගැනීමටත්, ඉහත සඳහන් ලිපිනයෙහි පදිංචිය පිළිබඳ සෑහෙන සාක්‍ෂි ඉදිරිපත් කිරීමටත් මම එකඟ වෙමි.

————,
දෙමව්පිය/භාරකරුගේ අත්සන.

දිනය :————.

9–485—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාර අංකය : 1/59/13 (ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට බඳවා ගැනීමේ (සිංහල) විභාගය—1964 පෙබරවාරි

අංක 14,319 හා 1965.2.12 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකළ නිවේදනයට අමතරවයි. 1964 පෙබරවාරි 1 වැනි සහ 8 වැනි දිනයන්හි පවත්වන ලද ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට බඳවා ගැනීමේ (සිංහල) විභාගයේ ප්‍රතිඵල අනුව, පහත සඳහන් අපේක්ෂක/අපේක්ෂිකාවන් ද ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට පත් කිරීමට තෝරා ගෙන ඇති බව මෙයින් දැනුම් දෙමි.

| නම | ලිපිනය |
|---|---|
| කරන්නාගොඩ, සෝ. (මෙනෙවිය) | ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල අමාත්‍ය කාර්යාලය, කොළඹ 1. |
| කහවිට, ම. (මහත්මිය) | "ජී" ශාඛාව, මහා භාණ්ඩාගාරය, කොළඹ 1. |
| ගුණරත්න, ප. ර. | සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය. |
| දයාවතී, ක.ම.ආ. (මහත්මිය) | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1502, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1. |
| නිමලාවතී, ප. (මෙනෙවිය) | රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, "ඊ" ශාඛාව, කොළඹ 1. |
| පතිරණ, නි. ක. | කම්කරු විනිශ්චය සභා කාර්යාලය, අංක 11, රෝස්මීඩ් පෙදෙස, කොළඹ 7. |
| සුවිනීතා, පියසීලි, වී. (මෙනෙවිය) | ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව (පාලන අංශය), ටොරින්ටන් චතුරශ්‍රය, කොළඹ 7. |
| ප්‍රනාන්දු, පා.හෙ.රු. (මෙනෙවිය) | ආනයන හා අපනයන පාලක දෙපාර්තමේන්තුව, "සෙලින් කෝ මන්දිරය", 69, රැජිණ වීදිය, කොළඹ 1. |
| වෙල්ලාලගේ, සු. (මෙනෙවිය) | රජයේ මුද්‍රණාලය, කොළඹ 8. |
| රාජපක්‍ෂ, අ. | වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, කොළඹ 1. |

එච්. ඊ. කුරේ,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1965 සැප්තැම්බර් 3 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

9–414—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුව

1965 ඔක්තෝබර් මස 10 වෙනි දින සිට 1966 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා රත්මලාන ගුවන් තොටුපලෙහි ආහාර පානාදිය විකිණීම සඳහා ටෙන්ඩර් 65.9.27 වැනි දින පෙ. ව. 10 දක්වා කොළඹ, තැ. පෙ. 535, ලෝටස් පාරෙහි සිවිල් ගුවන් සේවා අධ්‍යක්‍ෂ විසින් භාර ගනු ලැබේ.

සිවිල් ගුවන් සේවා අධ්‍යක්‍ෂ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල (දෙපිටපතකින් යුතුව) ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු වේ. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 25 ගෙවා සිවිල් ගුවන් සේවා අධ්‍යක්‍ෂ කාර්යාලයෙන් හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකින් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර 65.9.25 වැනි දින පෙ. ව. 10 දක්වා ලබාගත හැක. වැඩි විස්තර සිවිල් ගුවන් සේවා අධ්‍යක්‍ෂ කාර්යාලයෙන් ලබාගත හැකිවේ.

ඩබ්ලිව්. ඇල්. පී. ද මැල්,
සිවිල් ගුවන්සේවා අධ්‍යක්‍ෂ.

තැ. පෙ. 535,
කොළඹ 1.
1965.9.4 දින දී ය.

9–439—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

## යුද්ධ හමුදා මූලස්ථානය

**පනාගොඩ ලංකා යුද්ධ හමුදා සේවා බලකායට ශීතකරණ යන්ත්‍රයක් සැපයීම හා සවිකිරීම**

ඉහත දක්වෙන සේවාව සඳහා ටෙන්ඩර්පත්‍ර කොළඹ 1, උත්තර මන්ත්‍රණ සභා ගොඩනැගිල්ලෙහි පිහිටා ඇති රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් 1965 ඔක්තෝබර් මස 26 වන දින පූ. භා. 9.30 තෙක් භාරගනු ලැබේ.

2. පනාගොඩ, යුද්ධ හමුදා ජනපදයේ, යුධෝපකරණ අධ්‍යක්ෂක මණ්ඩලයෙන් මෙම ටෙන්ඩර් පත් 1965 ඔක්තෝබර් මස 20 වන දින අ. භා. 12 වනතෙක් නිකුත් කරනු ඇත. කොළඹ 3, පහළ වැව පාරේ, යුද්ධ හමුදා මූලස්ථානයේ පිහිටි ගණකාධිකාරි කාර්යාලයෙහි සිවිල් පාලක නිලධාරි තැන වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 තැන්පත්කොට ලත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් මෙම ටෙන්ඩර් පත් ලබාගත හැක.

3. මෙම ශීතකරණ යන්ත්‍රය සවිකරන ගොඩනැගිල්ලේ සැලැස්ම මෙම අධ්‍යක්ෂක මණ්ඩලයේදී බලාගත හැක.

4. මෙම ටෙන්ඩර් පිළිබඳ වැඩි විස්තර කාර්යාල වේලාවන්හිදී, පනාගොඩ, යුධ හමුදා ජනපදයේ, යුධෝපකරණ අධ්‍යක්ෂක මණ්ඩලයෙන් ලබාගත හැක.

බී. පී. එෆ්. ජයරත්න,
ලුතිනන්/කර්නල්,
යුද්ධ හමුදා ආඥාපති වෙනුවට.

යුධෝපකරණ අධ්‍යක්ෂක මණ්ඩලය,
යුද්ධ හමුදා ජනපදය,
පනාගොඩ, හෝමාගම,
1965 අගෝස්තු මස 30 දින.

9–363—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 218 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|
| 1. 1965.10.1 සිට 1966.9.30 තෙක් සිමෙන්ති කොන්ක්‍රීට් පයිප්ප සැපයීම. ... | 1965.10.5 |
| 2. 1965.10.1 සිට 1966.9.30 තෙක් ඇස්බෙස්ටෝස් තහඩු සැපයීම ... | 1965.10.19 |
| 3. පිඩන ලාම්පු සැපයීම ... | 1965.10.19 |
| 4. මෙරට සෑදූ කැරම් ලෑලි සහ දාම් ලෑලි සැපයීම ... | 1965.10.5 |
| 5. කපු රෙදිපිළි සැපයීම ... | 1965.10.26. |

කොන්ක්‍රීට් පයිප්ප සැපයීම සම්බන්ධයෙන් ඒ ඒ ටෙන්ඩර්කරුවන් විසින් කොළඹ 7, බුලර්ස් පාරේ අංක. 363 දරණ " විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනයෙන් " තමන්ගේ සැම්පල් පරීක්ෂා කරවා ගෙන ඒ සඳහා ලැබෙන සහතික පත් ස්වකීය ටෙන්ඩර් සමග ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාර්සන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝරම කොල ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝරම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1965 සැප්තැම්බර් 9 දින,
කොළඹදීය.

9–424—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## කුණ්ඩසාලේ එළිමහන් සිර කඳවුරේ කර්මාන්ත අංශයෙන් අමු ද්‍රව්‍යයන් මිළයට ගැනීම—1965-66

පහත අත්සන් කරණ මා විසින් කුණ්ඩසාලේ එළිමහන් සිර කඳවුරේ කර්මාන්ත අංශයෙන් පහත සඳහන් අමු ද්‍රව්‍යයන් මිළයට ගැනීම සඳහා වූ ටෙන්ඩර් 1965 සැප්තැම්බර් 28 වෙනි දා පෙරවරු 10.30 දක්වා බාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පිළිගනු ලබන්නේ ලාංකිකයන්ගෙන් පමණකි.

3. ටෙන්ඩර් සහ ආරක්ෂණ තැන්පත් මුදල් පහත සඳහන් ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් මෙසේ විය යුතුයයි තීරණය කොට ඇත :—

| ද්‍රව්‍යය | | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ශ. | | ආරක්ෂණ තැන්පත් මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|---|
| (1) සතියකට කැමට ගන්නා බිත්තර සාමාන්‍ය 800 ක් පමණ (රාත්තල) | ... | 10 | 0 | ... | 200 | 0 |
| (2) දිනයකට සාමාන්‍යයෙන් රබර් කිරි රාත්තල් 5 ක් පමණ ... | ... | 10 | 0 | ... | 100 | 0 |

4. පහත සඳහන් ආයතන සඳහා නියමිත ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමේදී ආපසු ගෙවන තැන්පත් ඇප මුදල් අවශ්‍ය නොවේ :—

(1) සමූපකාර තොග වෙළඳ ආයතනය,

(2) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන,

(3) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂක විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, හා

(4) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරණ ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ, ඒ සඳහාම නියමිත පෝර්මයන් මගින් පමණකි. ඒ ලබා ගත හැක්කේ 1965 සැප්තැම්බර් 27 වෙනිදා පස්වරු 2 දක්වා පමණක් පිළිගනු ලබන ඉහත සඳහන් ද්‍රව්‍යය සඳහා වෙන වෙනම සඳහන් කොට ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කොට ලබා ගත් රිසිට් පත් ඉදිරිපත් කිරීමෙන් බවත්, මේ ටෙන්ඩර් තැන්පත් මුදල් කුණ්ඩසාලේ එළිමහන් සිරකඳවුරේ කාර්යාලයේ ද, වෙන ඕනෑම කච්චේරිය කද තැන්පත් කළ හැකිය.

6. ටෙන්ඩර් පත්‍රයන් සිල් තැබූ කවරයන්හි බහා එහි වම් පස කෙලවරේ " ද්‍රව්‍යයන් මිලයට ගැනීමේ ටෙන්ඩරය " යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි කළ තැපැලෙන් එවීම හෝ පහත සඳහන් කරණ අයගේ කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම හෝ කළ හැකිය.

7. නියම කරණ ලද මිල ගණන් ටෙන්ඩර් පත්‍රයන්හි අකුරෙන් හා ඉලක්කම් වලින් දැක්විය යුතුයි. එසේ ඉලක්කම් වලින් සහ අකුරෙන් සඳහන් නොකළ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත. ටෙන්ඩර් පත්‍රයන් පිරවීමෙන් පසු කිසියම් වෙනසක් කිරීම හෝ අමුතු එක් කිරීමක් ඇතුළත් කළ හොත් ඒ බව ටෙන්ඩර්කරුවන් විසින්ම අත්සන් තබා සැබෑ බවට සහතික කළ යුතුයි.

8. වර්ෂ 1965 සැප්තැම්බර් 28 වෙනි දින පෙරවරු 10.30 ට පහත අත්සන් කරන අයගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එහි දී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට පුළුවන.

9. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් හේතු රහිතව ප්‍රතික්ෂේප කිරීමේ හා කොන්ත්‍රාත්තුවක් ඕනෑම අවස්ථාවක නවතාලීමේ සම්පූර්ණ අයිතිය කුණ්ඩසාලේ එළිමහන් සිරකඳවුරේ සහකාර අධිකාරි තැන වෙත පැවරී ඇත.

10. කොන්ත්‍රාත්තුව ලබා ගැණීමට හැකිවූ කොන්ත්‍රාත්කරු ඒ බව දන්වා එවූ විට දින 10 ක් ඇතුළත දී කුණ්ඩසාලේ එළිමහන් සිරකඳවුරේ සහකාර අධිකාරි තැන සමග ගිවිසුම් පතකට අත්සන් තැබිය යුතුයි. එම කාල සීමාව තුළදී කොන්ත්‍රාත් ගිවිසුමට අත්සන් කිරීමට ටෙන්ඩර්කරු අපොහොසත් වුනි නම් එම කාල සීමාව තුළදී ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජ සන්තක කොට ඔහුගේ නම සහ ලිපිනය වගකීම් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියෙහි ඇතුලත් කරනු ලැබේ.

11. තවත් වැඩි විස්තර දැන ගැනීමට ඇවැසි නම්, පහත අත්සන් කරණ අයගෙන් ඒ ලබා ගත හැක.

ජෙ. ව. අබේනායක,
බන්ධනාගාර සහකාර අධිකාරි තැන.

එළිමහන් සිරකඳවුර, කුණ්ඩසාලේ,
1965 සැප්තැම්බර් මස 10 වෙනි දින දීය.

9–401—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ගාල්ල උප කොට්ඨාශය

ගාල්ල උප කොට්ඨාශයේ තොටගොඩ තුන්හවුල කුඹුර අමුණ ව්‍යාපාරය ඉදිකිරීම සඳහා ටැන්ඩර් පත් 1965 ඔක්තෝබර් මස 5 වැනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා තංගල්ලේ දකුණු කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටැන්ඩර විවෘත කිරීම එවලේම එහිදී සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 25,000 හෝ ඊට වැඩි ගණන කට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, සම්තිද ඇතුලුව, මෙම වැඩය සඳහා ටැන්ඩර අයැදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1965 ඔක්තෝබර් මස 1 වැනි සිකුරාදා වන තෙක්, එදින ඇතුළුව, කාර්යාල වේලාවන් තුළදී ගාල්ල, හම්බන්තොට සහ තිස්ස වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයන්ගෙන් ලබා ගත හැකි ෆෝර්මවල ටැන්ඩර අයැදුම් පත් සකස් කළ යුතුය. ටැන්ඩර ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටැන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරණ වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටැන්ඩර් කිරීමට ඉඩ දිය යුතුද නැත්ද යනු සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ෆෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රු. 25 ක ටැන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. මේ ටැන්ඩර් ගැන සියලු විස්තර, ගිවිසුම්, සැලසුම් විශේෂ විස්තර යනාදිය කාර්යාල වේලාවන් තුළදී ගල්ලේ, හිරිඹුරේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ඒ. එෆ්. මහගමගේ,
වාරිමාර්ග ඉංජිනේරු,
ගාල්ල, උ. කො.

ගාල්ල. 1965 සැප්තැම්බර් 1 දින දීය.

9-260—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### කොළඹ උප කොටස

පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1965 ඔක්තෝබර් මස 5 වෙනි අඟහරුවාද පෙරවරු 10.00 දක්වා කොළඹ 5, ජාවත්ත පාරේ බටහිර කොටසේ, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම සිදු කෙරේ.

| වැඩයේ නම | කොන්ත්‍රාත්කරු ලියාපදිංචි වියයුතු මුදල රු. ශ. | | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ. | |
|---|---|---|---|---|
| 1. කොරතොට සුළු ගංවතුර ආරක්ෂක ව්‍යාපාරය ඉදිකිරීම ... | 48,000 | 0 | 50 | 0 |
| 2. මුතුරාජවෙල ව්‍යාපාරයේ ජා-ඇල වේල්ලේ තුම්මෝදර කපොලු දෙකකින් යුත් නිර්මානයක් ඉදිකිරීම ... | 22,000 | 0 | 25 | 0 |
| 3. රංවල මැදපේන ඇල සුළු ගංවතුර ආරක්ෂක නිර්මානය ඉදිකිරීම... | 35,000 | 0 | 50 | 0 |

2. ඉහත සඳහන් එක් එක් වැඩය ඉදිරියෙන් දක්වෙන ගණනට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවූ කොන්ත්‍රාත් කරුවන් පමණක් මේ වැඩ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝවෙති.

3. 1965 ඔක්තෝබර් මස 1 වැනි සිකුරාද වනතෙක් (එදින ඇතුළුව) කාර්යාල වේලාවන්තුළදී පහත සඳහන් කාර්යාලවලින් ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍රවල අයදුම් පත් ඉදිරිපත්කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් හා දනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩදිය යුතුද, නැද්ද ? යනු සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය.

1. කොළඹ උප කොටස — ජාවත්ත පාර, කොළඹ 5
2. කළුතර උප කොටස — උතුරු කළුතර
3. ගම්පහ උප කොටස — ගම්පහ
4. රත්නපුර උප කොටස — හිදැල්ලන, රත්නපුර

4. තවද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට ප්‍රථම එක් එක් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ටෙන්ඩර් තැන්පත් මුදල ඉහත සඳහන් කාර්යාල වල හෝ ලංකාවේ ඕනෑම කච්චේරියක තැන්පත්කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

5. මෙම ටෙන්ඩර් පිළිබඳ සියළුම විස්තර කාර්යාල වේලාවන්තුළදී කොළඹ වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත හැක.

ඇම්. ජී. සී. පී. විජයතිලක,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
කොළඹ උප කොටස.

1965 සැප්තැම්බර් 3 ද,
කොළඹ 5, ජාවත්ත පාර,
වාරිමාර්ග කාර්යාලයය.

9-403—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පොලිතීන් සැපයීම

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් ප්‍රමාණවල පොලිතීන් නාරාහේන්පිට කෘෂිකර්ම මධ්‍යම ගබඩාවට සැපයීම සඳහා 1965 සැප්තැම්බර් 24 දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ:—

පොලිතීන් නාලාකාර (Tubular Film) රාත්තල් 10,000

පොලිතීන් කවර (Bags)

| ගේජ් | පළල දිග | අවශ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| 300 | 9×12 | 500 |
| 300 | 6×7 | 1,000 |
| 150 | 3×6 | 1,000 |
| 150 | 6×15 | 1,000 |
| 150 | 6×12 | 35,000 |
| 150 | 8×12 | 15,000 |
| 150 | 9×18 | 10,000 |
| 150 | 8×12 | 5,000 |
| 150 | 6×9 | 2,500 |
| 150 | 6×4 | 2,000 |
| 150 | 6×8 | 15,000 |
| 150 | 4×8 | 15,000 |

ඉහත සඳහන් පොලිතීන් තොගය 1966 සැප්තැම්බර් 30 වෙනිදා දක්වා කාලයට අවශ්‍ය වන ප්‍රමාණය හෙයින් කෘෂිකර්ම මධ්‍යම ගබඩාවේ සම්බන්ධතා නිලධාරි තැන විසින් නියම කරන පරිදි ඒ ඒ කාල සීමා වලදී කොටස් වශයෙන් සැපයීමට ටෙන්ඩර්කරුවන් සූදානම් විය යුතුයි.

2. කොළඹ නාරාහේන්පිට මධ්‍යම බඩු ගබඩාවේ සම්බන්ධතා නිලධාරිගෙන් ලබා ගත හැකි ආකෘතිපත්‍ර වල අනු පිටපතක් ද සහිතව ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි. මේ සම්බන්ධයෙන් එවන සෑම ටෙන්ඩරයක්ම පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති නමට යැවිය යුතු අතර ටෙන්ඩර් බහාලන කවරයේ වම්පස මුදුනේ කෙළවර " පොලිතීන් සැපයීම සඳහා ටෙන්ඩර් " යනුවෙන් සඳහන් කළ යුතුය.

3. මේ සඳහා එවන ටෙන්ඩර්පත්‍ර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කිරීම හෝ ලියා පදිංචි කළ තැපැලෙන් ඉදිරිපත් කිරීම කළ යුතුය. ටෙන්ඩර්පත්‍ර ලියා පදිංචි කළ තැපැලෙන් නොඑවන්නේනම් ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි " පොලිතීන් සැපයීම සඳහා ටෙන්ඩර්පත්‍ර " යනුවෙන් ද සඳහන් කොට මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත්‍ර ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් ටෙන්ඩර් භාරගැනීමට බලය ලත් නිලධාරි තැන වූ පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, කාර්යාල සහකාර වෙත පෞද්ගලිකව බාර දී ලැබුනු බවට කුවිතාන්සියක් ලබා ගත යුතුයි. එවනු ලබන ටෙන්ඩර්පත්‍ර වල ඒ සඳහා සපයා ඇති ස්ථානයෙහි ටෙන්ඩර්කරු විසින් යථා පරිදි අත්සන් කරන ලද, ටෙන්ඩර් කොන්දේසි වල පිටපතක්ද තිබිය යුතුය.

4. ටෙන්ඩර්කරුවන්ට උවමනා නම්, ඔවුන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින්ට ටෙන්ඩර් විවෘත කරන වේලාවෙහි පැමිණ සිටීමට හෝ ඒ වේලාවෙහි තම තමන්ගේ ටෙන්ඩර් පත්‍රවල අනු පිටපත් පරීක්ෂා කර බැලීමට අවසර දෙනු ලැබේ. පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී, ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දින යට කී වේලාවට ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ.

5. ටෙන්ඩරයට රුපියල් 100 බැගින් තැන්පත් කළ බවට ඉදිරිපත් කරන කුවිතාන්සිය මත 1965.9.23 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. කොළඹ මහා භාණ්ඩාගාරයෙහි හෝ තමන් කැමති

වන ඉල්ලුම්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැඩ සහ ඒවායේ වටිනාකම් දැක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ තිබේද? නැද්ද යන්න ගැන සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ යුතුය. ෆෝර්ම කොළ නිකුත් කිරීමට ප්‍රථම රු. 25 ක තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ දිවයිනේ ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ සම්බන්ධයෙන් ගිවිසුම්, වැඩ සැලසුම් ආදී වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළදී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

එම්. රතිනම්,
වාරිමාර්ග ඉංජිනේරුතැන,
අනුරාධපුර උප කොටස.

1965 සැප්තැම්බර් 2 දින.

9-442—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### නියමිත මිල යෝජනාක්‍රමය හා වී කෙටීම

කොළඹ එඩින්බරෝ චන්ද්‍රවංක අංක 42 ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් මරදානේ පිහිටි ටියුනිසියා ගබඩාවට හොඳ පරන බුසල් 2½ (දෙක හමාර) හිස් ගෝනි 50,000ක් සැපයීම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් 1965 සැප්තැම්බර් 17 වැනි සිකුරාදා අ. භා. 2.30 තෙක් භාරගනු ලැබේ.

2. දිවයිනේ කච්චේරියකට හෝ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 60, හෝර්ටන් පෙදෙස කාර්යාලයේ ගණකාධිකාරිතැනට රු. 200 ක තැන්පත් මුදලක් ගෙවා ලබාගත්තාලද කුවිතාන්සියක් අංක 42 එඩින්බරෝ චන්ද්‍රවංක කාර්යාලයේ ටෙන්ඩර් අංශයට ඉදිරිපත්කොට 1965 සැප්තැම්බර් 17 වැනි දින දවල් 12 වනතෙක් නිකුත්කරනු ලබන ටෙන්ඩර්පත් ලබාගෙන අනුපිටපතක් ද සහිතව පුරවා එවිය යුතුයි.

3. වැඩි විස්තර පහත සඳහන් කාර්යාලයෙන් හෝ ටියුනිසියා ගබඩාවේ සැපයීම් අංශයේ ගණකාධිකාරි තැනගෙන් විමසා දැනගත හැක.

කේ. සිත්තම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1965 සැප්තැම්බර් 9 වැනි දින,
කොළඹ 7, තැ. පෙ. 537,

9-433—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## අනුරාධපුර දිසාපති කාර්යාලයේ අංක ඊ. වයි. 7702 දරණ ජීප් රථය විකිණීම

අනුරාධපුර දිසාපති කාර්යාලයේ අංක ඊ. වයි. 7702 දරණ " විලිස් බේබි" ජීප් රථය විකිණීම සඳහා 1965 සැප්තැම්බර් මස 24 වැනි දින පෙරවරු 11 වන තෙක් ටෙන්ඩර් පත්‍රිකා භාරගනු ලැබේ. 1965 සැප්තැම්බර් මස 24 වැනි දින පස්වරු 3 ට අනුරාධපුර දිසාපති කාර්යාලයේ අංක 5 දරණ කාමරයේ දී ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන අතර ටෙන්ඩර්කරුවන්ට එම අවස්ථාවේ දී එහි පෙනී සිටිය හැකි ය.

2. සියළු ම ටෙන්ඩර් පත්‍රිකා පිටපත් දෙකකින් යුතුව මුද්‍රා තබා එම පත්‍රිකා බහාලන කවරයේ වම් කෙළවරේ " අංක ඊ. වයි. 7702 දරණ ජීප් රථය" යනුවෙන් සඳහන් කොට ලියාපදිංචිකළ තැපැලෙන් "අනුරාධපුර දිසාපති, දිසාපති කාර්යාලය, අනුරාධපුරය" යන ලිපිනයට එවිය යුතුය. නැතහොත් අනුරාධපුර දිසාපති කාර්යාලයේ ඒ සඳහා සපයා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

3. මෙම ටෙන්ඩර් ආකෘති පත්‍ර 1965 සැප්තැම්බර් මස 23 වැනි දින පස්වරු 3 වන තෙක් රුපියල් 100 ක මුදලක් තැන්පත් කිරීමෙන් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ය.

4. සතියේ දිනයන් හි පෙරවරු 10 සිට පස්වරු 3 දක්වා ද සෙනසුරාදා පෙරවරු 10 සිට පස්වරු 12.30 දක්වා ද කච්චේරි භූමියේ දී මෙම රථය පරීක්ෂා කර බැලිය හැකි ය.

පී. එච්. ප්‍රේමවර්ධන,
අනුරාධපුර දිසාපති.

1965 අගෝස්තු මස 31 වැනි දින,
අනුරාධපුර, දිසාපති කාර්යාලයේ දී ය.

9-425—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### යාපනයේ තින්නවෙලි ගොවිකම් පාසලේ ඇට ගන්නා ලද මිරිස් පොතු ටොන් 10ක් පමණ විකිණීම

පේරාදෙනිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් යාපනයේ තින්නවෙලි ගොවිකම් පාසලේ ඇති ඇට ගන්නා ලද මිරිස් පොතු ටොන් 10 ක් පමණ විකිණීම සඳහා 1965 සැප්තැම්බර් මස 24 වන දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

මිල ගණන් සඳහන් කළ යුත්තේ මිරිස් පොතු රාත්තලක් සඳහා විය යුතුයි.

2. චවුනියාවේ කෘෂිකර්ම නිලධාරි (ගොවිපළ පාලනය හා නිෂ්පාදනය) තැනගෙන් ෆෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක බහා, සීල් තබා " පේරාදෙනිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති" යන්න එහි පිට ලියා එහිම මුදුන් වම් කෙළවරේ " යාපනයේ තින්නවෙලි ගොවිකම් පාසලේ මිරිස් පොතු විකිණීම සඳහා ටෙන්ඩරය " යන්න ලියා එවිය යුතුයි.

3. 1965.9.24 වන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. එසේ නිකුත් කරනු ලබන්නේ එක් එක් ටෙන්ඩර් පතයක් වෙනුවෙන් රු. 50 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත් කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10 ක් ඇතුලතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වූවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම් ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වන්නට ද ඉඩ තිබේ. මෙයට අතිරේකව කොන්ත්‍රාත්කරුගෙන් වෙනත් අය කිරීම් ඉල්ලා සිටීමට ද ආණ්ඩුවට බලය ඇත.

4. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචිකළ තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් නොඑව්වොත්, ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් හෝ විසින් පේරාදෙනිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් ලිපිකරු තැනට ඒවා අතින්ම භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහා ලන ලද කවරයෙහි " යාපනයේ තින්නවෙලි ගොවිකම් පාසලේ මිරිස් පොතු විකිණීම සඳහා ටෙන්ඩරය " යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි. ලියාපදිංචිකළ තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණ බව ඒවා විවෘත කරන දිනයේදීම සියළුම ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුලත යම් ටෙන්ඩර්කරුවකුට එවැනි දැන්වීම් නොලැබුණහොත් ඔහු පේරාදෙනිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර් කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී පේරාදෙනිය, කෘෂිකම් දෙපාර්තමේන්තුවේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත ෆෝර්මයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස පිළිගනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයත් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර, ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර් කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද, පිළිගනු ලැබූවාවූ ද දේවල මුළු ගණනින් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂගේ නමින් තැන්පත් කිරීමටත් ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකර නිමවූවිට පසු පමණි,

## 1965-66 මුදල් වර්ෂයේ ප්‍රථම භාගයට චන්ද්‍රිකාවැව ව්‍යාපාරයට ප්‍රාදේශීය බඩු සැපයීම

චන්ද්‍රිකාවැව ව්‍යාපාරයට අයත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ පහත දැක්වෙන අංශ සඳහා ප්‍රාදේශීය බඩු සැපයීමට චන්ද්‍රිකාවැව ඉඩම් සංවර්ධන නිලධාරි වන මා විසින් 1965 සැප්තැම්බර් මස 23 වැනි දින සවස 3.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ :—

1. හම්බන්තොට පො. ගො. අංශය
2. සූරියවැව පො. ගො. අංශය
3. වීරකැටිය පො. ගො. අංශය
4. රත්මලේ කන්ද මාර්ග තැනීමේ අංශය
5. කපුගම්සොත පැලම් තැනීමේ අංශය.

ප්‍රාදේශීය ද්‍රව්‍ය :

කළුගල් 6×9 කියුබ් ගණනින්
කළුගල් 2" කියුබ් ගණනින්
කළුගල් 1½" කියුබ් ගණනින්
කළුගල් 1" කියුබ් ගණනින්
කළුගල් ¾" කියුබ් ගණනින්
කළුගල් ½" කියුබ් ගණනින්

සැපයීම් පිළිබඳ මිල ගණන් වෙන වෙනම දැක්විය යුතුයි.

(අ) වත්තේදී/පෝරතුවේදී/ගල්වලේදී ලොරි යාහැකි ස්ථාන විය යුතුයි. සැතපුම් 5 ක් ඇතුලත විය යුතුයි.

(ආ) කාර්ය ස්ථානයට.

මුදලින් රු. 50 ක් මගේ කාර්යාලයේ තැන්පත් කිරීමෙන් හෝ කච්චේරියක තැන්පත්කොට හෝ ලබා ගත් රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන් අනුමත කරන ලද ටෙන්ඩර් පෝරම මාගෙන් ලබා ගත හැක. ටෙන්ඩර් පෝරම දෙනු ලබන්නේ 1965 සැප්තැම්බර් මස 23 දින පෙ. ව. 10.30 දක්වා පමණි.

මාගේ කාර්යාලයෙන් සපයනු ලබන නියමිත ටෙන්ඩර් පෝරම්වල ඉල්ලුම් කළ යුතු අතර ඒවා ලියුම් කවරයක බහා සීල් තබා මාගේ කාර්යාලයේ ඇති 'ටෙන්ඩර් පෙට්ටියට' දැමීම හෝ ඉඩම් සංවර්ධන නිලධාරි චන්ද්‍රිකාවැව, යන ලිපිනයට ලියා පදිංචිකළ තැපෑලෙන් හෝ එවිය හැක. ටෙන්ඩර් බහා එවනු ලබන ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරෙහි "ප්‍රාදේශීය බඩු සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුයි.

1965 සැප්තැම්බර් මස 23 වැනි දින ප. ව. 3.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැක.

ඉඩම් සංවර්ධන නිලධාරි ගේ නියමය පරිදි නියම කරනු ලැබූ ද්‍රව්‍ය ප්‍රමාණය වරින් වර දක්වා දෙසතියක් ඇතුලත සැපයීමට පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුට හැකිවිය යුතු අතර මා සමග පොරොන්දු පත්‍රයකට අත්සන් තබා පොරොන්දුවකට බැඳිය යුතුයි. සැපයීම පැහැර හරින හෝ සැපයීමට අපොහොසත්වන ටෙන්ඩර් කරුවන්ගේ නම් කොන්දේසි කඩකළ අයගේ ලැයිස්තුවට ඇතුලත් කිරීමට සුදුසු වන අතර තැන්පත් මුදල රජය සතුවෙනවා ඇත.

තවද වැඩිදුර විස්තර පහත අත්සන්කරන නිලධාරි තැනගෙන් ලබා ගත හැක.

රා. ක්‍රි. සෝමසුන්දරම්,
චන්ද්‍රිකාවැව ඉඩම් සංවර්ධන නිලධාරි.

ඉඩම් සංවර්ධන කාර්යාලය,
චන්ද්‍රිකාවැව, පදලංගල,
කහවත්ත.
1965. 8. 24 දින.

9-430—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු කොටස භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් මුලතිව් උපකොට්ඨාශයේ පහත සඳහන් වැඩ සඳහා 1965 ඔක්තෝබර් මස 5 වැනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාරගෙන එවෙලේම විවෘත කරනු ලැබේ.

| වැඩෙහි නම | | ලියා පදිංචි විය යුතු මුදල | | තැන්පත් මුදල |
|---|---|---|---|---|
| | | රු. | | රු. |
| (1) වවුනිකුලම් ව්‍යාපාරයෙහි ප්‍රධාන වම් ඇලෙහි 6 වැනි සැතැප්ම ඉදිකිරීම | ... | 40,000 | ... | 50 |
| (2) තෙගුලන්කුලම් වැවෙහි වාන ඉදිකිරීම සහ පස් වැඩ කිරීම සඳහා | ... | 20,000 | ... | 50 |

1965 ඔක්තෝබර් මස 1 වැනි සිකුරාදා තෙක් කාර්යාල වේලාවන්හිදී, මන්නාරම, මුලතිව්, යාපනය, වවුනියාව සහ වවුනියාවේ ප්‍රාදේශික වාරි මාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාල වලින් ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත්‍ර සකස් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ඉල්ලුම්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි කළ පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ දිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ආකෘති පත්‍ර නිකුත් කිරීමට ප්‍රථම ඉහත සඳහන් 1 වැනි ඡේදයෙහි සඳහන් පරිදි ටෙන්ඩර් තැන්පත් මුදල ඔඩ්ඩුසුඩාන් වාරිමාර්ග කාර්යාලයෙහි හෝ ඕනෑම කච්චේරි යක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

3. මේ ටෙන්ඩර් ගැන සියලුම විස්තර කාර්යාල වේලාවන්හි ඔඩ්ඩු සුඩාන්හි පිහිටි මුලතිව් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

වී. බාලසුබ්‍රමනියම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන
මුලතිව් උපකොටස.

වාරිමාර්ග කාර්යාලය, ඔඩ්ඩුසුඩාන්,
1965 අගෝස්තු 23 වැනිදා.

9-1061—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## නියෝජ්‍ය ආහාර පාලකතැන, මාතර

**1965-66 වර්ෂයෙහි වැලිගම සැපයීම් මධ්‍යස්ථානයේ ආහාර ද්‍රව්‍ය ගෙන යෑම සහ පැටවීමට ටෙන්ඩර් කැඳවන ලද දැන්වීම අවලංගු කිරීම**

1965.8.27 වැනි දින ප්‍රසිද්ධ කරන ලද අංක 14,490 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද වැලිගම සැපයීම් මධ්‍යස්ථානයේ ආහාර ද්‍රව්‍ය ගෙනයාම සහ පැටවීම පිළිබඳ කැඳවන ලද ටෙන්ඩර් දැන්වීම මෙයින් අවලංගු කරනු ලැබේ.

ඇෆ්. සී. පීටර්ස්,
මාතර නියෝජ්‍ය ආහාර පාලකතැන.

1965.9.3 වැනි දින,
මාතර කච්චේරියේදීය.

9-367—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## පළාත්පාලන සේවා කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

**ද්‍රව්‍ය එතීම සඳහා යෝග්‍ය කඩදාසි ඇතුලු පරණ ප්‍රවෘත්තිපත්‍ර විකිණීම**

දළ වශයෙන් හොන්ඩර 4කට කිට්ටු ප්‍රමාණයකින් යුත් ද්‍රව්‍ය එතීම සඳහා යෝග්‍ය කඩදාසි තොගයක් විකිණීම පිණිස 1965 සැප්තැම්බර් මස 24 වෙනි දින පස්වරු 4.30 දක්වා කොළඹ, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති විසින් මිල ගණන් කැඳවනු ලැබේ.

2. කඩදාසි තොගය සතියේ දිනවල කාර්යාල වේලාවන් තුළදී කොළඹ, කෙළින් වීදියේ, ගපූර් ගොඩනැගිල්ලේ, පළමුවැනි මාලයේ, අංක 29 1/5 දරණ ස්ථානයේ දී පරීක්ෂාකර බැලීමට හැකිවේ.

3. ඉල්ලුම් පත් බහා එවන කවරයේ උඩ වම් කොණෙහි "පරණ පුවත් පත් මිලයට ගැනීමේ ඉල්ලුම් පත්‍රය" යන්න ලියා තැපෑලෙන් හෝ එසේ නොමැති නම් කාර්යාලයේ ලියුම් පෙට්ටියට දැමීමෙන් හෝ එදිනට ප්‍රථම ලැබෙන්නට සැලැස්විය යුතුවේ.

4. මෙම කාර්ය සඳහා ටෙන්ඩර් ආකෘති පත්‍ර නොමැත.

5. ඉල්ලුම්කරුවන් පරණ පුවත් පත් ගැසට් පත්‍රිකා හා පරණ කඩදාසි සඳහා රාත්තලකට වෙන් වෙන් වශයෙන් මිල ගණන් ඉදිරිපත් කළ යුතුවේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

අංක 29 1/5,
ගපූර් ගොඩනැගිල්ල, (පළමුවැනි මහළ),
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 530, කොළඹ,
1965 අගෝස්තු මස 31 දින.

9-404—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

8. මෙහි පළමුවැනි ඡේදයෙහි සඳහන් පරිදි ටෙන්ඩර්කරු විසින් ස්වකීය ගණන් යෝජනාව ටෙන්ඩර් බාර ගැනීමේ අවසනා දින සිට යටත් පිරිසෙයින් මාස 2 ක් වත් විවෘතව තැබිය යුතුයි.

9. කෙලින්ම ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමති විදේශීය නිෂ්පාදක මූලිකවරුන් වෙත ඔවුන්ගේ ලංකා නියෝජිතයින් සහ ඒජන්තවරුන් විසින් ටෙන්ඩර් කොන්දේසි උපලේඛන හා මෙම ටෙන්ඩරය පිළිබඳ සියළුම විස්තර පහත සඳහන් රටවල සිටින ලංකා ආණ්ඩුවේ නියෝජිතයින්ගෙන් ලබාගත හැකි බව දැන්විය යුතුවේ. මහා බ්‍රිතාන්‍යය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉතාලිය, පකිස්තානය, ජපානය, ප්‍රංශය, බටහිර ජර්මනිය, චීන මහජන සමූහ ආණ්ඩුව, සෝවියට් රුසියාව, කැනඩාව, නෙදර්ලන්තය, බෙල්ජියම, හන්ගේරියාව, බල්ගේරියාව, නැගෙනහිර ජර්මනිය, එක්සත් අරාබි සමූහ ආණ්ඩුව, බුරුමය, අයර්ලන්තය, අයිරානය, ඉරාකය, මාලදිවයින, උතුරු කොරියාව, ස්පාඤ්ඤය සහ ඉන්දියාව (බොම්බාය) සහ ඕස්ට්රේලියාවේ සිඩ්නි හි සිටින ලංකා වෙළඳ කොමසාරිස් සහ ලංකාවේ සිටින විදේශීය ආණ්ඩුවල නියෝජිතවරු සහ ඉන්දියාවේ, දිල්ලියේ සිටින ලංකාවේ විදේශීය නියෝජිතයන්ගෙන්.

10. මෙහි 1 වෙනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේ සෑම ටෙන්ඩර්කරුවෙකුට ම එම ස්ථානයේ සිටීමට අවසර ලැබේ. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිළ ගණන් එහි පැමිණ සිටි ටෙන්ඩර් කරුවන්ට කියවනු ලැබේ. ලැබී තිබුන ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට අවශ්‍ය නම්, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සමග කටයුතු පිළියෙල කර ගැනීමෙන් පසු එසේ පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු ලැබේ.

11. ටෙන්ඩර්කරුවන් විසින් රුපියලේ වටිනාකම හා විදේශීය විනිමය වටිනාකම වෙන වෙන ම තමන්ගේ මිළ ඉදිරිපත් කිරීම්වල සෑම විෂය අංකයක් වෙනුවෙන් ම සඳහන් කළ යුතු වන්නේ ය.

එස්. බාලක්‍රිෂ්නන්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1965. 9. 1,
කොළඹ 10, ඩීන්ස් පාරේ,
අංක 355 දරණ තැන පිහිටි,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) කාර්යාලයේ දී ය.

9–263—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## කෑගල්ල රජයේ මහළු නිවාසය

### කරනවැමි සේවා කොන්ත්‍රාත්තුව

1965 ඔක්තෝබර් 1 වන දින සිට අවුරුද්දක කාලසීමාවකට, කෑගල්ල රජයේ මහළු නිවාසයේ නේවාසිකයින්ගේ දැලි රැවුල් ගෑමටත්, කොණ්ඩා කැපීමටත්, අර්ධකාල කරනවැමියකුගේ සේවය සඳහා ටැන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ. මේ ගැන වැඩි විස්තර කෑගල්ල රජයේ මහළු නිවාසයේ අධිකාරි තැනගෙන් ලබාගත හැක.

2. ටැන්ඩර් පත්‍ර සීල් තබා, අධිකාරි තැන, රජයේ මහළු නිවාසය, කෑගල්ල යනුවෙන් පිට නම ලියා 1965.9.16 වන දවල් 10ට මත්තෙන් ඔහුට ලැබෙන්නට එවිය යුතුය. ටැන්ඩර් පත්‍ර පෞද්ගලිකව ගෙනවුත් ආයතනයේදී අධිකාරී තැනට භාරදිය හැකිය. නොඑසේ නම් ලියා පදිංචි තැපැලෙන් එවිය හැකිය.

3. ටැන්ඩර්, කෑගල්ල රජයේ මහළු නිවාසයේ අධිකාරිගෙන් ලබාගන්නා පෝර්මවල ලියා ඉදිරිපත් කළ යුතුය. ටැන්ඩර් පෝර්ම ලබා ගන්නට පැමිණිවිට, අවශ්‍ය නම් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ටැන්ඩර්කරුවන්ට තේරුම් කර දෙනු ඇත.

4. ටැන්ඩර් පත්‍රිකාවන් නිකුත් කිරීමට පෙර රු. 10 ක මුදලක් කච්චේරියේ තැන්පත් කොට එම කුවිතාන්සිය කෑගල්ල රජයේ මහළු නිවාසයේ අධිකාරී වෙත තමන්ම පැමිණ භාර දිය යුතුය. මේ මුදල පිළිගත් ටැන්ඩරය හිමි අය විසින් තැන්පත් කළයුතු ඇප මුදලේ කොටසක් වශයෙන් සලකනු ඇත. පොරොන්දුවට බැඳී වැඩ අරඹන්නට මත්තෙන්, පිළිගත් ටැන්ඩරය හිමි අය විසින් තැන්පත් කළයුතු ඇප මුදලේ ඉතිරි කොටස වශයෙන් රු. 40 ක මුදලක් ද තැන්පත් කළ යුතුවේ. ප්‍රතික්ෂෙප කරනු ලැබූ ටැන්ඩර් කරුවන්ගේ ඇප මුදල් පිළිගත් ටැන්ඩරය හිමි අය කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

5. ටැන්ඩර්කරුවන් දෙවිධියක ගාස්තු සඳහන් කළයුතුය. එනම්, එක් කෙනෙකුගේ රැවුල ගෑමට හා එක් කෙනෙකුගේ කොණ්ඩය කැපීමට වෙන වෙනම අය කරන ගාස්තු සහ මසකට අපේක්ෂිත ගාස්තුව, පිළිගත් ටැන්ඩරය හිමි අය මෙම ගාස්තු දෙවිධියටම අනුව කරනවැමි සේවය කිරීමට ගිවිසුමකට බැදිය යුතුය. සෑම මාසයකදීම කරන ලද රැවුල් ගෑම් හා කොණ්ඩා කැපීම් ගණන අනුව, ආණ්ඩුවට වඩා ලාබ ගාස්තු ක්‍රමය අනුව ගාස්තු ගෙවනවා ඇත. යථෝක්ත ගාස්තු ගණන් දෙකම ඉදිරිපත් නොකරන අයගේ ටැන්ඩර ප්‍රතික්ෂෙප කිරීමට සමාජසේවා අධ්‍යක්ෂ තැනට බලය තිබේ.

6. යම් ටැන්ඩර්කරුවකුගේ ටැන්ඩරය භාරගත් බවට ඔහුට දැනුම් දීමෙන් පසු ඔහු විසින් කොන්ත්‍රාත්තුවට බැඳීම ප්‍රතික්ෂෙප කළහොත්, නොහොත් එය පැහැර හැරියොත්, එසේත් නැතහොත්, අවශ්‍ය අවස්ථාවේදී ඇප මුදල නොබැන්දෙත්, ඔහුගේ ටැන්ඩර් ඇප මුදල රාජසන්තක කරනු ලැබේ.

7. යම් ටැන්ඩරයක් නොහොත් සියළුම ටැන්ඩර කිසිම විරුද්ධකමකට ඉඩ නොමැතිව ප්‍රතික්ෂෙප කරන්නටත්, අවුරුද්දකට නොවැඩි ඕනෑම කාලසීමාවකට යම් ටැන්ඩරයක් පිළිගන්නටත් ආණ්ඩුවට බලය තබාගනු ලැබේ.

අධිකාරී,
රජයේ මහළු නිවාසය,
කෑගල්ල.

1965.9.3.

9–314/1—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## කයිතඩි රජයේ මහළු නිවාසය

### දර ප්‍රවාහණය පිළිබඳ කොන්ත්‍රාත්තුව

1965 ඔක්තෝබර් 1 වන දින සිට අවුරුද්දක කාලසීමාවකට, කයිතඩි රජයේ මහළු නිවාසයට දර ප්‍රවාහණය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ. මේ ගැන වැඩි විස්තර කයිකඩි රජයේ මහළු නිවාසයේ අධිකාරිතැනගෙන් ලබාගත හැක.

2. ටැන්ඩර් පත්‍ර සීල් තබා, අධිකාරි තැන, රජයේ මහළු නිවාසය, කයිතඩි යනුවෙන් පිට නම ලියා 65.9.16 වන දින දවල් 12ට මත්තෙන් ඔහුට ලැබෙන්නට එවිය යුතුය. ටැන්ඩර් පත්‍ර පෞද්ගලිකව ගෙනවුත් ආයතනයේදී අධිකාරී තැනට භාරදිය හැකිය. නොඑසේ නම් ලියා පදිංචි තැපැලෙන් එවිය හැකිය.

3. ටෙන්ඩර්, කයිතඩි රජයේ මහළු නිවාසයේ අධිකාරිගෙන් ලබාගන්නා පෝර්මවල ලියා ඉදිරිපත් කළ යුතුය. ටැන්ඩර් පෝර්ම ලබා ගන්නට පැමිණිවිට, අවශ්‍ය නම් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ටැන්ඩර්කරුවන්ට තේරුම් කර දෙනු ඇත.

4. ටැන්ඩර් පත්‍රිකාවන් නිකුත් කිරීමට පෙර රු. 10ක මුදලක් කච්චේරියේ තැන්පත් කොට එම කුවිතාන්සිය කයිතඩි රජයේ මහළු නිවාසයේ අධිකාරී වෙත තමන්ම පැමිණ භාර දිය යුතුය. මේ මුදල පිළිගත් ටැන්ඩරය හිමි අය විසින් තැන්පත් කළයුතු ඇප මුදලේ කොටසක් වශයෙන් සලකනු ඇත. පොරොන්දුවට බැඳී වැඩ අරඹන්නට මත්තෙන්, පිළිගත් ටැන්ඩරය හිමි අය විසින් තැන්පත් කළයුතු ඇප මුදලේ ඉතිරි කොටස වශයෙන් තව රු. 90ක මුදලක් ද තැන්පත් කළ යුතුවේ. ප්‍රතික්ෂෙප කරනු ලැබූ ටැන්ඩර් කරුවන්ගේ ඇප මුදල් පිළිගත් ටැන්ඩරය හිමි අය කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

5. ටැන්ඩර්කරුවන් දෙවිධියක ගාස්තු සඳහන් කළයුතුය. එනම්, කෝප්පායි කැලෑ දෙපාර්තමේන්තුවේ මග අසල ඩිපෝවෙන් දර හොණ්ඩරයක් සහ දර ඝන යාරයක් පැටවීමට යන ගාස්තුව වෙනමත්, දර හොණ්ඩරයක් සහ දර ඝන යාරයක්, කයිතඩි රජයේ මහළු නිවාසයට ගෙන ගොස් බා අඩුක්කිරීමට යන ගාස්තු වෙනමත් වේ. යථෝක්ත ගාස්තු ගණන් දෙකම ඉදිරිපත් නොකරන අයගේ ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමට සමාජ සේවා අධ්‍යක්ෂතැනට බලය තිබේ.

6. යම් ටැන්ඩර්කරුවකුගේ ටැන්ඩරය භාරගත් බවට ඔහුට දැනුම් දීමෙන් පසු ඔහු විසින් කොන්ත්‍රාත්තුවට බැඳීම ප්‍රතික්ෂෙප කළහොත්, නොහොත් එය පැහැර හැරියොත්, එසේත් නැතහොත්, අවශ්‍ය අවස්ථාවේදී ඇප මුදල නොබැන්දෙත්, ඔහුගේ ටැන්ඩර් ඇප මුදල රාජසන්තක කරනු ලැබේ.

7. යම් ටැන්ඩරයක් නොහොත් සියළුම ටැන්ඩර කිසිම විරුද්ධකමකට ඉඩ නොමැතිව ප්‍රතික්ෂෙප කරන්නටත්, අවුරුද්දකට නොවැඩි ඕනෑම කාලසීමාවකට යම් ටැන්ඩරයක් පිළිගන්නටත් ආණ්ඩුවට බලය තබාගනු ලැබේ.

අධිකාරී,
රජයේ මහළු නිවාසය,
කයිතඩි.

1965.9.3.

9–314/2—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

## මීරිගම රජයේ මහළු නිවාසය

### මිනීපෙට්ටි සැපයීමේ කොන්ත්‍රාත්තුව

1965 ඔක්තෝබර් 1 වන දින සිට අවුරුද්දක කාලසීමාවකට මීරිගම රජයේ මහළු නිවාසයට මිනීපෙට්ටි සැපයීම සඳහා ටැන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ. මේ ගැන වැඩි විස්තර මීරිගම රජයේ මහළු නිවාසයේ අධිකාරිතැනගෙන් ලබාගත හැක.

2. ටැන්ඩර් පත්‍ර සීල් තබා, අධිකාරී තැන, රජයේ මහළු නිවාසය, මීරිගම යනුවෙන් පිට නම ලියා, 65.9.16 වන දින දවල් 12 ට මත්තෙන් ඔහුට ලැබෙන්නට එවිය යුතුය. ටැන්ඩර් පත්‍ර පෞද්ගලිකව ගෙනවුත් ආයතනයේ අධිකාරී තැනට භාරදිය හැකිය. නොඑසේ නම් ලියා පදිංචි තැපැලෙන් එවිය හැකිය.

3. ටැන්ඩර්, මීරිගම රජයේ මහළු නිවාසයේ අධිකාරිගෙන් ලබාගන්නා ෆෝර්ම්වල ලියා ඉදිරිපත් කළ යුතුය. ටැන්ඩර් ෆෝර්ම ලබා ගන්නට පැමිණිවිට, අවශ්‍ය නම් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ටැන්ඩර්කරුවන්ට තේරුම් කර දෙනු ඇත.

4. ටැන්ඩර් පත්‍රිකාවක් නිකුත් කිරීමට පෙර රු. 10 ක මුදලක් සමාජසේවා දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට එම කුවිතාන්සිය මීරිගම රජයේ මහළු නිවාසයේ අධිකාරී වෙත තමන්ම පැමිණ භාරදිය යුතුය. මේ මුදල පිළිගත් ටැන්ඩරය හිමි අය විසින් තැන්පත් කළයුතු ඇප මුදලේ කොටසක් වශයෙන් සලකනු ඇත. පොරොන්දුවට බැඳී වැඩ අරඹන්නට මත්තෙන්, පිළිගත් ටැන්ඩරය හිමි අය විසින් තැන්පත් කළ යුතු ඇප මුදලේ ඉතිරි කොටස වශයෙන් තව රු. 15ක මුදලක්ද තැන්පත් කළයුතු වේ. ප්‍රතික්ෂෙප කරනු ලැබූ ටැන්ඩර්කරුවන්ගේ ඇප මුදල් පිළිගත් ටැන්ඩරය හිමි අය කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

5. ටැන්ඩර්කරුවන් පහත සඳහන් විස්තර සැපයිය යුතුය:—

(අ) ඇල්බිසියා, ඇටඹ, රුක්අත්තන, කොලොන්, ගොන්න යන ලී එක් එක් වර්ගයෙන් සාදන ලද මිනීපෙට්ටියක මිල වෙන වෙනම.

(ආ) එම මිනීපෙට්ටියක් ආයතනයට ගෙනැවිත් දීමටත් සමග මිල.

(ඇ) එම මිනීපෙට්ටියක් ටැන්ඩර්කරුවාගේ කම්හලේදී භාරදෙන විට මිල.

මේ මිල ගණන් වලින් ආණ්ඩුවට වැඩියෙන් ලාබ මිල ගණනට මිනීපෙට්ටි සැපයීමට ටැන්ඩර්කරුවා රජය සමග පොරොන්දුවකට බැඳිය යුතුය. යථෝක්ත මිල ගණන් ඉදිරිපත් නොකරන අයගේ ටැන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමට සමාජ සේවා අධ්‍යක්ෂ තැනට බලය තිබේ.

6. යම් ටැන්ඩර්කරුවකුගේ ටැන්ඩරය භාරගත් බවට ඔහුට දැනුම් දීමෙන් පසු ඔහු විසින් කොන්ත්‍රාත්තුවට බැඳීම ප්‍රතික්ෂෙප කළහොත්, නොහොත් එය පැහැර හැරියොත්, එසේත් නැතහොත්, අවශ්‍ය අවස්ථාවේදී ඇප මුදල නොබැන්දොත්, ඔහුගේ ටැන්ඩර් ඇප මුදල රාජසන්තක කරනු ලැබේ.

7. යම් ටැන්ඩරයක් නොහොත් සියළුම ටැන්ඩර කිසිම විරුද්ධවීමකට ඉඩ නොමැතිව ප්‍රතික්ෂෙප කරන්නටත්, අවුරුද්දකට නොවැඩි ඕනෑම කාලසීමාවකට යම් ටැන්ඩරයක් පිළිගන්නටත් ආණ්ඩුවට බලය තබාගනු ලැබේ.

අධිකාරී,
රජයේ මහළු නිවාසය,
මීරිගම.

1965.9.3.

9–314/3—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුව

### පාවිච්චියට නුසුදුසු තැපැල් වෑන් රථ විකිණීම

පහත දැක්වෙන පාවිච්චියට නුසුදුසු වෑන් රථවලින් එකක් හෝ වැඩි ගණනක් හෝ සියල්ල මිල දී ගැනීමට අපේක්ෂා කරන අයගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

(1) මොරිස් ජේ තැපැල් රථය ... සී වී. 2623

(2) ඔස්ටින් තැපැල් රථය ... සී වී. 105

(3) පජෝ ස්ටේෂන් වැගන් රථය ... ඊ වයි. 7349

(4) ෆෝඩ් තේම්ස් ස්ටේෂන් වැගන් රථය ... ඊඑන්. 2175

මෙම වෑන් රථ පරීක්ෂා කර බැලීමට අවශ්‍ය වේ නම්, කොළඹ 10 මැකලම් පාරේ, තැපැල් ප්‍රවාහන අංශයේ, පරීක්ෂක තැන (ටෙලිෆෝන් 4192) සමග සාකච්ඡා කර පිළියෙල කරගත යුතුය.

තැපැල් කායඹාලයක රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ, ඒ බවට ලබා ගන්නා ලද කුවිතාන්සියක්, කොළඹ ප්‍රධාන තැපැල් කාර්යාලයේ තැපැල් අධිකාරී තැන වෙත ඉදිරිපත් කිරීමෙන් 1965.9.29 දින පස්වරු 4 වනතෙක් ටෙන්ඩර් පත්‍ර ෆෝරම ලබාගත හැක. මෙසේ ලබා ගන්නා ලද නියමිත ෆෝරමයක නොලියූ කිසිම ටෙන්ඩර් පත්‍රයක් සලකා බලනු නොලැබේ.

යමෙකුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව පෝස්ට්මාස්ටර් ජනරාල් තැන විසින් හෝ ඒ වෙනුවෙන් බලය පවරා ඇති වෙනයම් නිලධාරියෙකු විසින් ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 14 ක් ඇතුළත දී ටෙන්ඩරයෙහි සම්පූර්ණ වටිනාකම තැපැල් කාර්යාලයක තැන්පත් කිරීමට නුපුළුවන් විණි නම් හෝ එසේ කිරීමෙන් වැලකී සිටි නම් තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වනවා ඇත. අනිකුත් සැම තැන්පත් මුදලක්ම වෙන්දේසිය අවසන් වූ විගස ආපසු ගෙවනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර බහාලූ කවර සීල් තබා ඒවායේ වම් පැත්තේ උඩ කෙළවරේ "පාවිච්චියට නුසුදුසු තැපැල් වෑන්රථ මිලදී ගැනීම සඳහා ටෙන්ඩරය (ප්‍රධාන තැපැල් කාර්යාලීය ප්‍රවාහන සේවය)" යැයි ලියා 1965.9.30 දින පෙ. ව. 10 ට පෙර තැපැල් අධිකාරී තැන වෙත ලැබෙන සේ එවිය යුතුයි.

තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. තැපැලෙන් නො එවනු ලබන ටෙන්ඩර් පත්‍ර කවරයක බහා සීල් තබා ටෙන්ඩර්කරු විසින් හෝ ඔහුගේ නියෝජිතයකු විසින් කොළඹ ප්‍රධාන තැපැල් කාර්යාලයේ, තැපැල් අධිකාරී තැනට භාරදී ඒ භාරගත් බවට ලියවිල්ලක් ලබාගත යුතුයි.

1965.9.30 දින පෙ. ව. 11 ට කොළඹ ප්‍රධාන තැපැල් කාර්යාලයේ, පෝස්ට්මාස්ටර් ජනරාල් තැනගේ කාමරයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. මේ වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් ඔවුන් මිලදී ගන්නා ලද වාහන ඉවත් කර ගැනීමට සුදුසු විධිවිධාන යොදාගත යුතුය.

කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩර් පත්‍ර සමහරක් හෝ සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ බලය රජය වෙත තබාගනු ලැබේ.

ඒ. එල්. පෙරේරා,
වැඩබලන පෝස්ට්මාස්ටර් ජනරාල්.

ප්‍රධාන තැපැල් කාර්යාලය,
කොළඹ.
65.9.3.

9–372—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## බඩු බාහිරාදිය විකිණීම්

### රේගු වෙන්දේසිය

පහත සඳහන් බඩු 1965 සැප්තැම්බර් මස 16 වෙනි බ්‍රහස්පතින්දා පෙ. ව. 9.30 ට පයනියන්ත වේදිකාවේ පිහිටි රේගු ගමන් බඩු කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ:—

මාලු දැල් 14ක්
අත් ඔරලෝසු 7ක්
සාරි 7ක්
සවර්ණාභරණ කොටස් 6යි
කැපට් 1යි
විදුලි ශක්තිය දැක්වීමේ යන්ත්‍රයක්
රෙදි විවීමේ මැෂින් හී කොටස්.
දුරකථන යන්ත්‍ර සවිකිරීමේ මැෂිමක්.
ෆෝර්ලික්ස්, ඔවල්ටින්, චීස්, සැකරින්, ලිපිද්‍රව්‍ය, ලිප්, බයිසිකල් කොටස්, රෙදි පිළි සහ වෙනත් බඩු.

ප්‍රධාන රේගු අයකැමි.

බී.ඕ. 148/11/65.
ගමන් බඩු කායඹාලය,
කොළඹ, 1965.8.28 වෙනි දින.

9–386—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීම

අළුත කපන ලද පුත්තලම අඩවියේ ඇති බුරුත, වැවරණ, මිල්ල, හුලංහික්, පානක්කා, හල්මිල්ල හා හැළඹ කඳන් 1,022 කින් සමන්විත ඝණ අඩි 4148.6 ක් 1965 සැප්තැම්බර් මස 20 වන දින උදය 10.00 ට පුත්තලම අඩවි කැලෑ කාර්යාලයේදී වයඹ දිසා කැලෑ නිලධාරි විසින් වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන්ට දැව වෙන්දේසියට පෙර දැව පරීක්ෂා කර බැලිය හැක.

වැඩි විස්තර සඳහා පුත්තලම අඩවි වන නිලධාරි හෝ වයඹ දිසා කැලෑ නිලධාරි විමසන්න.

ස. මුත්තයියා,
වයඹ දිසාභාර කැලෑ නිලධාරි.

තැ. පෙ. අංක 10,
දිසා කැලෑ කාර්යාලය,
කුරුණෑගල.
65.9.28,

9–398—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියයි

යාපනයේ මධ්‍යම දැව ගබඩා භූමියේ ඇති පහත දැක්වෙන දැව මවිසින් 1965 සැප්තැම්බර් මස 14 දින පෙරවරු 10ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දන්වා සිටිමි :—

කඳන් 200 = ඝන අඩි 1875.5
ඉරූ ලී කැබලි 562 = ඝන අඩි 246.6
රීප්ප දික් අඩි 600
වෙලං වටලී 222

වෙන්දේසියට පළමු එම දැව පිරික්සා බලන ලෙස ඉල්ලුම්කිරීමට බලාපොරොත්තුවන්නන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. වැඩි විස්තර මගෙන් හෝ යාපනය මධ්‍යම දැව ගබඩාවේ ගබඩාකරුගෙන් හෝ දැනගත හැක.

ඒ. සී. ආර්. රත්නරාජා,
උතුරු දිසා වන නිලධාරි.

උතුරු දිසා වන කාර්යාලය,
යාපනය, 65.9.1.

9–397—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීමයි

බුරුත, හල්මිල්ල යන වශීයෙන් කඳන් 19 කින් සමන්විත ඝන අඩි 241.8 ගොඩවල් 4 කින් යුත් දැව තොගයක් හා ඉරූ දැව ඝන අඩි 12.2 ගොඩ 1 කින් යුතු දැව තොගයක් 1965 ඔක්තෝබර් මස 6 වෙනි බදාදා උදේ 10.00 ට කල්මුනේ අඩවියේ හුලනුගේ මාශීසන්න ගබඩාවේ හා හුලනුගේ ගම්කාරයී සභික මහතාගේ නිවාසය අසල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම් කරුවන්ට දැව වෙන්දේසි කිරීමට පෙර පරීක්ෂාකර බැලිය හැක.

වැඩි විස්තර සඳහා පහත අත්සන් කරන මාගෙන් හෝ කල්මුනේ අඩවි වන නිලධාරිගෙන් හෝ විමසන්න.

කෙ. අරුල්වෙල්වම්,
නැගෙනහිර දිසාවේ දිසා වන නිලධාරි.

1965.9.30 දින,
මඩකලපුව,
දිසා වන කාර්යාලයේ දී ය.

9–396—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීමයි

බුරුත, හල්මිල්ල, හුලන්හික්, රාතෝ යන වශීයෙන් කඳන් 95කින් සමන්වීත ඝන අඩි 904.6 ගොඩවල් 19 කින් යුත් දැව තොගයක් 1965 සැප්තැම්බර් මස 23 වෙනි බ්‍රහස්පතින්දා උදය 10.00 ට කල්මුනේ මධ්‍යම දැව ගබඩාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම් කරුවන්ට දැව වෙන්දේසි කිරීමට පෙර පරීක්ෂාකර බැලිය හැක.

වැඩි විස්තර සඳහා පහත අත්සන් කරන මාගෙන් හෝ කල්මුනේ මධ්‍යම දැව ගබඩාකරුගෙන් හෝ විමසන්න.

කෙ. අරුල්වෙල්වම්,
නැගෙනහිර දිසාවේ දිසා වන නිලධාරි.

1965.8.26 දින,
මඩකලපුව,
දිසා වන කාර්යාලයේ දී ය.

9–395—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීම

තිඹොල්කැටිය රජයේ ලී මෝලෙහි ඇති තොග 57 කින් යුත් i, ii හා iii පන්තිවල ඉරූ දැව ඝන අඩි 3242.5 ක් පමණ 1965 ඔක්තෝබර් මස 8 වෙනි දින පෙ. ව. 10.00 ට වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියේ ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන භවතුන්හට වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම දැව පරීක්ෂා කර බැලීමට උපදෙස් දෙනු ලැබේ.

වෙන්දේසිය පිළිබඳ තවදුරටත් අවශ්‍ය විස්තර මගෙන් හෝ තිඹොල්කැටිය ලී මෝලේ කාර්යභාර නිලධාරි වෙතින් හෝ ලබා ගත හැක.

හෙක්ටර් සේනානායක,
බටහිර දිසාවේ දිසා වන නිලධාරි.

දිසා වන නිලධාරි කාර්යාලය,
රත්නපුරය,
1965.8.27 දින.

9–394—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ශීතකරනයක් වෙන්දේසියේ විකිණීමයි

ඝන අඩි 8.6 ප්‍රමාණයේ "ඩීලුක්ස්" නෝර්ජ් වර්ගයේ ශීතකරන යක්, 1965, ඔක්තෝබර් මස 6 වැනි දින පෙරවරු 10.30 ට, කොළඹ කොටුවේ පිහිටි, රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ, ගබඩා අංශයේදී, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මෙම ශීතකරණය, යථෝක්ත බඩු ගබඩාවේදී, සතියේ දින වල පෙරවරු 9.30 සිට පස්වරු 4 දක්වා පරීක්ෂා කර බැලිය හැක.

3. ඉල්ලුම්කරු විසින්, වෙන්දේසිය අවසන්වූ විගසම එහි මුදල් සම්පූර්ණයෙන්ම ගෙවා, ශීතකරනය, එදිනම කාර්යාලයෙන් ඉවත් කළ යුතුයි.

ජේ. එච්. රත්නායක,
වැඩබලන රෙජිස්ට්‍රාර් ජනරාල්.

1965, අගෝස්තු මස 24 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේදී.

9–250—65.9.9 දින අංක 14 501 දරන ගැසට් පත්‍රය

## ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

### අප්‍රයෝජන ද්‍රව්‍ය වෙන්දේසි කිරීම

මෙහි පහත සඳහන් ද්‍රව්‍ය 1965 සැප්තැම්බර් මස 21 වෙනි අඟහරුවාදා, කොළඹ ටොරින්ටන් චතුරශ්‍රයේ පිහිටි රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේදී අ. භා. 2 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

| | | |
|---|---|---|
| 1. එපිඩයස් කෝප්, ලීවිෂ්ගේ (සම්පූර්ණ) | ... | 1 යි. |
| 2. ස්ප්‍රිතු ලාම්පු, ලෝහමය ... | ... | 2 යි. |
| 3. ලී මේස ... | ... | 1 යි. |
| 4. විදුලි උඳුන් (ප්‍රේස්) ... | ... | 2 යි. |
| 5. බයිසිකල් (රලේ 22") ... | ... | 1 යි. |
| 6. කේන්ද්‍රාපසාරකය (අතින් ක්‍රියාකරවන) | ... | 1 යි. |
| 7. කොඩාපන් ලාම්පු (ඡායාරූප කළුවරකාමර සඳහා) | | 5 යි. |
| 8. අඩු ඊයම් මුද්‍රා ... | ... | 1 යි. |
| 9. වර්තනාංක මානය (බූට්රෝ) | ... | 2 යි. |
| 10. වර්තනාංක මානය (ඕලිඕ) | ... | 1 යි. |
| 11. අඩු, ඇඳය සහිත ... | ... | 1 යි. |
| 12. ස්කුරුප්පු නියම් ... | ... | 1 යි. |
| 13. සිල්ලු, (ඡායාරූප ගැනීමේ) | ... | 1 යි. |
| 14. විද්‍යුත් තාපක ... | ... | 2 යි. |
| 15. ප්‍රෙස් පැස්පිල් ... | ... | 1 යි. |

වෙන්දේසිය පැවැත්වෙන දිනයේ උදේ 10 යේ පටන් දවල් 12 දක්වා වූ කාලය ඇතුළත දී මෙකී ද්‍රව්‍ය පරීක්ෂා කළ හැකිවන්නේ ය. සාර්ථක ඉල්ලුම්කරු විසින් ඒවායේ වටිනාකම්, එවිටම මුදලින් ගෙවා වෙන්දේසිය අවසානයේදී ද්‍රව්‍ය ඉවත්කරගත යා යුතුව ඇත.

ආණ්ඩුවේ රස පරීක්ෂක

1965 අගෝස්තු 30 දින,
ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව,
**කොළඹ 7.**

9-259—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

ගම්පහ පොලිස් ගබඩාවේ තිබෙන පොලිස් නිලධාරීන් විසින් පරිහරනය කරන ලද නිල ඇඳුම් සහ වෙනත් බඩු තොගයක් සම්බන්ධවයි.

වර්ෂ 1965 සැප්තැම්බර් මස 18 වෙනි දින පෙ. ව. 9 ට ඉහත සඳහන් නිල ඇඳුම් සහ වෙනත් බඩු තොගයක් බස්නාහිර පළාතේ උතුරු කොටසේ ගම්පහ පොලිස් මූලස්ථාන භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම බඩු බාහිරාදිය බැලීමට අවශ්‍ය අය සඳහා 1965 සැප්තැම්බර් 15 වෙනි දින පෙ : ව : 9 සිට ප : ව : 4 දක්වා ඉඩසලසනු ලැබේ.

විකිණීමට ඇති බඩු වලින් සමහරක් පහත දැක්වේ :—

හම් සපත්තු කුට්ටම් 322

ඇල තොප්පි 185

බූට්ස් සපත්තු කුට්ටම් 88

කලු වැහිකබා 18

කාකි හටකබා 47

කාකි කැලැකබා 18

කාකි කොටකලිසම් 76

මෙම බඩුවල වටිනාකම් එවලෙහිම වෙන්දේසිකරුට ගෙවියයුතු බවද මිළයට ගන්නා ලද බඩු එදිනම ගෙන යායුතු බවද මෙයින් දන්වමි.

ඩී. ඇප්. ඇල්. පී. ආර්. සේනානායක,
පොලිස් අධිකාරි, බ. ප. (උතුර).

ගම්පහ, 65. 9. 2.

9-262—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## යුද හමුදා මූලස්ථානය

### පරිහරණයට නුසුදුසු රථ වාහන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පහත දැක්වෙන පරිහරණයට නුසුදුසු රථ වාහන, හෝමාගම පනාගොඩ පිහිටි යුධෝපකරණ ගබඩාවේදී 1965 සැප්තැම්බර් මස 24 වෙනි සිකුරාදා පෙරවරු 10ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

| | | | |
|---|---|---|---|
| (අ) ඔස්ටින් හොන්ඩර 30 | ... | ... | 5 |
| (ආ) ඔස්ටින් ඇම්බියුලන්ස් | ... | ... | 1 |
| (ඇ) පෝඩ්සන් තේම්ස් ටොන් 3 | | ... | 3 |
| (ඈ) විලීස් ජිප් ... | ... | ... | 2 |
| (ඉ) විලිස් ජීප් ... | ... | ... | 10 |
| (ඊ) බෙඩ් පෝඩ් ටී.ඊ.වී. | ... | ... | 1 |
| (උ) බී. ඇස්. ඒ. මෝටර් සයිකල් ... | | ... | 1 |

2. අවසාන මිටි පහර පතිත වනවාත් සමග සම්පූර්ණ මුදල් ගෙවිය යුතු අතරම, එදිනම පස්වරු 4ට පෙර මිළ දී ගත් රථ වාහන ඉවත් කර ගත යුතුයි.

3. මෙම රථ වාහන ඉහත සඳහන් ස්ථානයේදී 1965 සැප්තැම්බර් මස 23 වෙනි බ්‍රහස්පතින්දා පෙරවරු 9.30 සිට පස්වරු 4 දක්වා පරීක්ෂා කර බැලිය හැක.

බී. පී. එෆ්. ජයරත්න,
ලුතිනන්/කර්නල්,
යුද හමුදා ආඥපති වෙනුවට.

යුද හමුදා මූලස්ථානය
තැ. පෙ. 553,
කොළඹ,
1965 සැප්තැම්බර් මස 2 දින දීය.

9-363—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

අංක ඒබී/371 (හා)

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### නිවාස සඳහා ඉල්ලුම් පත්‍ර—පයාගල නිවාස ක්‍රමය

පයාගල උතුර සාදා ඇති කුලියට සින්නවීමේ ක්‍රමයට දිය හැකි අඩුකුලී නිවාස සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ලංකාවේ පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ :—

(අ) තමන්ගේ සහ තමන්ගේ භාර්යාවගේ/පුරුෂයාගේ සම්පූර්ණ මාසික ආදායම රු. 400 කට නොවැඩි අය ;

(ආ) තමන්ගේ නමින් හෝ තමන්ගේ භාර්යාවගේ/පුරුෂයාගේ නමින් හෝ තමන්ගෙන් යැපෙන ළමයෙකුගේ නමින් හෝ ගෙයක් හෝ ගෙයක් තැනීමට සුදුසු ඉඩමක් නොමැති අය.

2. සෑම ගෙයක්ම පිහිටා ඇත්තේ දළ වශයෙන් පර්චස් 10-12ක් අතරවූ ඉඩමක ය. ගෙවල්වල වහලට ඇස්බැස්ටෝස් සෙවිලිකර ඇති අතර, බිම සිමෙන්තියෙන් සාදා ඇත. එක ගේයකට ඉදිරිපස හා පිටුපස ආලියන්දයක්, නිදන කාමරයක්, කාමරයක්, මුළුතැන් ගෙයක් හා යාබද වැසිකිලියක් ද බැගින් තිබේ. බීම පිණිස ජලය නිවාස ක්‍රමය තුළ තිබෙන ළිංවලින් ලබාගත හැක. මෙම ගෙවල් සඳහා ඉල්ලුම්පත් එවීමට පෙර, ඒවා ඔබට සුදුසුයැයි පරීක්ෂාකර බැලිය යුතුය.

3. මෙම නිවාසයක් සඳහා අවුරුදු 25 කින් මුළු මුදල ගෙවී යන පරිදි ගෙයක මාසික කුලිය රුපියල් 50 ක් පමණ වේ.

4. මෙ ඉල්ලුම්කරුවන් අතරින්, නිවාස ලබා ගැනීමට අපොහොසත් වන අයදුම්කරුවන්ට එහි ඇති හිස් ඉඩම් කොටස් බෙදා දීමට බලාපොරොත්තු වනු ලැබේ. මෙම දෙපාර්තමේන්තුවේ සම්මත සැලැස්මක් අනුව එහි නිවාසයක් තැනීමට එක් අයෙකුට රු. 5,000 කට නොවැඩි ණය මුදලක් දෙනු ඇත. ඉඩම් කොටස හා ණය මුදල පමණක් ලබා ගැනීමට කැමති අය, ඒ බව ඉල්ලුම් පතෙහි 4 වන ඡේදයේ සඳහන් කළ යුතුයි.

5. ගෙයි පදිංචිකාරයා යම්කිසි අවස්ථාවක දී ශේෂව තිබෙන මුදල එකවිට ගෙවා දැමීමෙන් පසු ගෙයි නිත්‍යානුකූල අයිතිය ඔහුට පවරා දෙනු ලැබේ. ගෙයි පදිංචියට ගිය දා සිට ගෙයි පදිංචිකාරයා විසින්ම ගෙය නඩත්තු කළයුතුවා පමණක් නොව, ගෙවල් කුලිය ද, වරිපනම් හා වෙනත් ගාස්තු ද ගෙවිය යුතු වේ.

6. ඉදිරි කාලයේ දී පොදු පහසුකම් සඳහා යම්කිසි මුදලක් වියදම් කිරීමට සිදුවුවහොත්, එම මුදල් නිවාස ක්‍රමයේ පදිංචිකරුවන්ගෙන් සම සමව කොටස් වශයෙන් ඉතිරි කාලය ඇතුළත අයකරනු ලැබේ.

7. ගෙවල්වල පදිංචිය සඳහා සුදුසු අය තෝරා ගනු ලබන්නේ ජාතික නිවාස කොමසාරිස්වරයා විසිනි.

8. ඉල්ලුම්පත් පිළියෙල කළ යුත්තේ, මගේ කාර්යාලයෙන් නොමිලේ ලබාගත හැකි විශේෂ ආකෘතිපත්‍රවලය.

9. පිළියෙල කරන ලද ඉල්ලුම්පත් ජාතික නිවාස කොමසාරිස් තැන වෙත පහත සඳහන් ලිපිනයට 1965.10.9 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ :—ජාතික නිවාස කොමසාරිස්, ජාතික නිවාස දෙපාර්තමේන්තුව, තැ. පෙ. 544, කොළඹ 2.

10. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනයේ සිට දින 21 ක් ගත් වූ විට, එය ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ලියාපදිංචි කරන ලද ලිපියකින් ඒ බව මා වෙත දැන්විය යුතුය. ඉල්ලුම්පත් බහා එවනු ලබන ලියුම් කවරයේ පිට වම් පැත්තේ, ඉහළ කෙළවරේ "පයාගල නිවාස සඳහා ඉල්ලුම්පත්" යැයි සඳහන් කළ යුතුය.

1965.8.28, කොළඹ 2.

ජාතික නිවාස කොමසාරිස්.

9-415—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

සැම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සැම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි